කාර්ය සාධන හා ගිණුම් වාර්තාව - 2022
செயற்பாட்டுமற்றும் கணக்கு அறிக்கை - 2022
Performance and Accounts Report - 2022



දිස්ත්‍රික් ලේකම් කාර්යාලය- රත්නපුර
மாவட்ட செயலாளர் -இரத்தினபுரி
District Secretariat-Ratnapura

ශීර්ෂය தலைப்பு Head	278

අන්තර්ගතය

පිටුව

දිස්ත්‍රික් ලේකම්ගේ පණිවිඩය

01. වන පරිච්ඡේදය - ආයතනික පැතිකඩ **05**
- 1.1 හැඳින්වීම
- 1.2 දැක්ම, මෙහෙවර සහ අරමුණු
- 1.3 ප්‍රධාන කාර්යයන්
- 1.4 ආයතනික ව්‍යුහය - සංවිධාන සටහන
- 1.5 ප්‍රාදේශීය ලේකම් කාර්යාල
- 1.6 දිස්ත්‍රික්කයේ විෂය පථය යටතේ ඇති අනෙකුත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු
- 1.7 විදේශ ආධාර යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

02. වන පරිච්ඡේදය - ප්‍රගතිය සහ ඉදිරි දැක්ම **13**
- 2.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ව්‍යාපෘති වල මූල්‍ය/භෞතික ප්‍රගතිය
  - i. සංවර්ධන වැඩසටහන්
  - ii. ඉදිකිරීම් හා වැඩිදියුණු කිරීම්
  - iii. ස්වභාවික විපත් වලින් හානියට පත් මාර්ග,ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ
- 2.2 අනාගතය සඳහා ඉදිරි දැක්ම

03 වන පරිච්ඡේදය - සමස්ත මූල්‍ය කාර්ය සාධනය **43**
- 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය
- 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
- 3.3 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය
- 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්
- 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය
- 3.6 වෙන් කර ඇති ප්‍රතිපාදන භාවිතා කිරීමේ කාර්ය සාධනය
- 3.7 අනෙකුත් දෙපාර්තමේන්තු සඳහා ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන/මේ සඳහා දෙපාර්තමේන්තු/ දිස්ත්‍රික්ක සඳහා නියෝජිතයෙකු ලෙසF.R 208 යටතේ ලේකම් කාර්යාලය/පළාත් සභාව
- 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය
- 3.9 විගණකාධිපති වාර්තාව

04 වන පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක **63**
- 4.1 හැඳින්වීම
- 4.2 කාර්ය සාධන දර්ශක

05 වන පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDGs) සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සාධනය **65**
- 5.1 තිරසාර සංවර්ධන අරමුණු (SDGs) අත්පත් කර ගැනීමේ කාර්ය සාධනය
- 5.1 හඳුනාගත් තිරසාර සංවර්ධන අරමුණු අත්පත් කර ගැනීමේදී මුහුණ දුන් අභියෝග සහ ජයග්‍රහණ

06 වන පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ **68**
- 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය
- 6.2 ආයතන යේ කාරය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම
- 6.3 මානව සම්පත් සංවර්ධනය

07 වන පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව **73**

විගණන වාර්තාව **78**

දිස්ත්‍රික් ලේකම් / දිසාපතිතුමාගේ පණිවුඩය



රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 වර්ෂයේදී සිය ක්‍රියාකාරිත්වය තුළින් ළඟාකර ගත් කාර්ය සාධනය විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කරමින් "කාර්ය සාධන හා ගිණුම් වාර්තාව - 2022 " මෙසේ ඔබ වෙත පිළිගන්වමි.

2019-21 වර්ෂයන් රටක් වශයෙන් කොවිඩ් උවදුර සඳහා මුහුණ දෙමින් පෙර වර්ෂයන්ට වෙනස් ආකාරයෙන් ආපදා සිදුවූ වසරක් ලෙසද 2022 වර්ෂය දැඩි ආර්ථික අවපාතයකට ලක් වූ වසරක් ලෙස ද හැඳින්විය හැකිය. ඒ අතර "යහපාලනය තුළින් සමෘද්ධිය" දැක්ම කරගත් රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට දිස්ත්‍රික්කයේ ජීවත්වන මිලියන 1.2 ක් පමණ වන ජනතාවගේ ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා වෙනත් ව්‍යවස්ථාපිත ආයතන වල සහභාගිත්වයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ 2,179 ක් පමණ වන කාර්ය මණ්ඩලය මනා ලෙස කළමනාකරණය කරමින් ඉලක්කගත අරමුණු කරා මෙහෙයවීමට පැවරුණු වගකීම නිසිපරිදි සිදු කිරීමට හැකි වී ඇතැයි මා විශ්වාස කරමි.

රත්නපුර නගර සංවර්ධන සැලැස්මේ අවසාන ඉලක්කය වන්නේ ජීවත්වීමට සුදුසු නගරයක් නිර්මාණය කිරීමයි. එකී දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූලික වගකීම වන්නේ ශක්තිමත් සහ තිරසාර ආර්ථික සංවර්ධනයයි. ඒ උදෙසා රාජ්‍ය මට්ටමින් සියළුම ආයතන සඳහා නායකත්වය හා මහජනේවීම ලබා දීමත් දිස්ත්‍රික්කය තුළ පීඩාවට පත් ජන කොටස් සඳහා අවම පිරිවැය යටතේ වැඩසටහන් ප්‍රමුඛතාගත කිරීමත් ආයතනයේ වගකීමයි.

2030 වසර වනවිට තිරසාර ආර්ථිකයක් සඳහා පදනම සකස් කරමින් සමස්ත රාජ්‍ය ප්‍රවේශය ක්‍රියාත්මක කිරීමේ විශේෂිත ක්‍රියාවලිය යටතේ, ආර්ථික අර්බුදය හමුවේ දැඩි බලපෑමකට ලක්ව ඇති ජන ජීවිතය යථාවත් කිරීම සඳහා බිම් මට්ටමේ දායකත්වය අප විසින් සැපයීම කළ යුතුව ඇත. ඒ සඳහා රජයේ ප්‍රවේශයන් වෙත යාමේදී ආයතනික පාලනය/ ගෝලීය පාලනය/යහපාලනය සහ නවීන පාලනය තුළ"සමස්ත-සමාජයේ" ප්‍රවේශයක් සඳහා සමාගම්, සිවිල් සමාජ සංවිධාන සහ පුද්ගලයන් රාජ්‍ය අංශය සමඟ ඒකාබද්ධව මෙහෙයවීම අවශ්‍ය වේ. එහිදී හුදෙක් ස්වකීය ආයතනයෙන් ඔබ්බට ගොස් සමස්ත ආර්ථිකයේ ආයතනික වියදම් සම්බන්ධව සිතා මනා මූල්‍ය කළමනාකරණය තුලින්, උපරිම පහසුකම් සහිතව පරිවර්තනීය වෙනසක් සිදු කළ යුතු වේ.

කොවිඩ් වසංගතය නිමවීමත් සමඟ ජන ජීවිතය ගොඩනැගීම සඳහා සෞඛ්‍ය සේවය සමඟ අත්වැල් බැඳ ගනිමින් සහනාධාර ප්‍රමුඛ කොට ගත් සමාජ සේවා සඳහා වැඩි අවධානයක් යොමු කිරීමටත්, අධ්‍යාපන/ කෘෂිකර්මය/ ප්‍රවාහන/ ග්‍රාම සංවර්ධන හා පළාත් මාර්ග සංවර්ධනය සඳහා භාණ්ඩාගාරයෙන් වෙන් වන ඒකාබද්ධ අරමුදල් මනා කළමනාකාරීත්වයක් සහිතව වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් ක්ෂේත්‍ර ගණනාවක් සඳහා කාර්යක්ෂම හා ඵලදායීව හැසිරවීමට හැකියාව ලැබී ඇත.

අවසන් වශයෙන්, 2022 වර්ෂයේ මෙම ප්‍රගතිය අත්පත් කර ගැනීම සඳහා මූලිකත්වය දුන් එවකට මෙම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් ලේකම් ලෙස කටයුතු කළ මාලනී ලොකුපොතාගම මහත්මියත්, කාර්ය සාධන වාර්තාව පිළියෙල කිරීමේදී ඒ වෙනුවෙන් දායක වූ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනෙකුත් සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයින් හා ආයතන කෘතවේදීව සිහිපත් කරන අතර ඒ සඳහා ලැබුණු සහාය ඉතා අගය කොට සළකමි.

.....
වසන්ත ගුණරත්න
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
රත්නපුර පරිපාලන දිස්ත්‍රිකය.

01 පරිච්ඡේදය
ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කය

භූගෝලීය පිහිටීම

වර්ග කිලෝමීටර් 3275.4 ක විශාලත්වයකින් යුතු මෙම දිස්ත්‍රික්කය ලංකාවේ 06 වන විශාලතම දිස්ත්‍රික්කය වේ. දිස්ත්‍රික්කයේ නිරපේක්ෂ පිහිටීම සැලකීමේ දී උතුරු අක්ෂාංශ 6.230 - 6.930 හා නැගෙනහිර දේශාංශ 80.170 – 80.950 අතර පිහිටා ඇත. සාපේක්ෂ පිහිටීමට අනුව උතුරින් කැගල්ල හා නුවරඑළිය දිස්ත්‍රික්ක වලින් ද දකුණින් ගාල්ල, මාතර හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක වලින් ද බස්නාහිරින් කොළඹ හා කළුතර දිස්ත්‍රික්ක වලින් ද නැගෙනහිරින් මොණරාගල හා බදුල්ල දිස්ත්‍රික්ක වලින් ද සීමා වන රත්නපුර දිස්ත්‍රික්කය දිවයිනේ වැඩිම දිස්ත්‍රික්ක ගණනකින් මායිම් වන දිස්ත්‍රික්කයයි. භූ විෂමතාවය සැලකීමේදී දිස්ත්‍රික්කයේ ඇතැම් ප්‍රදේශ මුහුදු මට්ටමේ සිට මීටර් 50 කටත් වඩා උන්නතාංශය අඩු වන අතර දිස්ත්‍රික්ක යේ මධ්‍ය ප්‍රදේශය මීටර් 400 ක් පමණ උන්නතාංශයකින් යුක්ත වේ. තවද බටහිර මායිම මීටර් 700 ක් පමණ ද, නිරිත දිග මායිම මීටර් 1300 ක් පමණ ද, උතුරු ප්‍රදේශ මීටර් 2500 ක් පමණ දක්වා ද උන්නතාංශය වෙනස් වේ. 2020 වර්ෂයේ සංඛ්‍යා ලේඛන තොරතුරු අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ මුළු ජනගහනය 1,190,059 ක් වේ. එයින් ස්ත්‍රී ජනගහනය 636,174 ක් වන අතර පුරුෂ ජනගහනය 609,016 කි. පවුල් ඒකක ගණන 342,027 කි. දිස්ත්‍රික්කයේ ජන ඝනත්වය සැලකීමේදී එය වර්ග කිලෝමීටරයට 382 කි.

2022 වර්ෂය වන විට රත්නපුර දිස්ත්‍රික්කයේ මුළු ජනගහනය 1,250,219 කි. ජන සංයුතිය අනුව බහුතරයක් සිංහල ජනයා වන අතර දෙමළ , මුස්ලිම් , බර්ගර් සහ මැලේ වැනි ජන වර්ගයන්ගෙන් යුක්ත වේ. ආගම් අනුව සලකා බැලීමේදී බෞද්ධ ජනයා බහුතරය වන අතර හින්දු, ඉස්ලාම්, ක්‍රිස්තියානි සහ රෝමානු වැනි භක්තිකයන්ද ජීවත් වේ. රත්නපුර නගරයේ වැඩි කොටසක් කළු ගඟේ ගංවතුර තැනිතලාවේ පිහිටා ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සාමාන්‍යයෙන් මැයි මාසය තුළ එය නිතිපතා ගංවතුරට මුහුණපායි. ජල ගැලීම් පාලනය කිරීම සඳහා කළු ගඟේ ඉහළට මහා පරිමාණ වේලි නොමැත. නගරයේ ගංවතුර අවදානම අවම කිරීමේ යෝජනා තවමත් ශක්යතා අදියරට පැමිණ නැත.

මූලික වශයෙන් කෘෂිකාර්මික අර්ථික පරිසරයකින් යුක්ත රත්නපුර දිස්ත්‍රික්කයේ සේවා නියුක්ත ජනගහනයෙන් වැඩි ප්‍රතිශතයක් කෘෂිකාර්මික අංශයේ සේවාවල නියුක්ත වේ. එය සේවා නියුක්ත ජනගහනයෙන් 42.3% ක ප්‍රතිශතයකි.කර්මාන්ත සහ සේවා අංශය සලකන විට එය පිළිවෙලින් 29.5% ක් හා 34.6% ක ප්‍රතිශතයක අගයක් ගනියි. දිස්ත්‍රික්කයේ විරැකියා අනුපාතය 3.2 % කි. කිසියම් විශේෂිත දැනුමක් හෝ පුහුණුවක් අවශ්ය නොවන රැකියාවල එනම් මූලික රැකියාවල 28.4% වැනි වැඩි ප්‍රතිශතයක් සේවා නියුක්තව සිටියි. කෘෂිකාර්මික නොවන ආර්ථික කටයුතු පවත්වාගෙන යන එනම් කර්මාන්ත , වෙළඳ සේවා කටයුතු පවත්වාගෙන යනු ලබන ඒකක 45,210 ක් දිස්ත්‍රික්කය තුළ පවතී. එම ඒකක වලින් වෙළඳාම පවත්වාගෙන යනු ලබන ඒකක වැඩි වශයෙන් දක්නට ලැබෙන අතර එය සංඛ්‍යාත්මකව 19,959 කි. කර්මාන්ත අංශයේ නියැළි ඒකක අඩු සංඛ්‍යාවක් වාර්තා වේ. එය 11,216 කි. තවද ආර්ථික වශයෙන් වැඩි වටිනාකමක් උසුලන මැණික්, දිස්ත්‍රික්කයේ වැඩියෙන්ම පැතිරුණු ඛණිජ වර්ගය වන අතර පුහුණු සහ නුපුහුණු ලෙස මැණික් කර්මාන්තයේ යෙදෙන බොහෝ පිරිසක් දිස්ත්‍රික්කයේ වෙසෙයි.

දිස්ත්‍රික්කයේ ඓතිහාසික පසුබිම හා එහි වැදගත්කම

දැනට සොයාගෙන ඇති පුරාවිද්‍යාත්මක සාධක අනුව පැරණිතම මිනිසා, එනම් බලංගොඩ මානවයා පිළිබඳ පාෂාණභූත ඇටසැකිලි සොයාගෙන ඇත්තේ රත්නපුර දිස්ත්‍රික්කයේ බට දොඹලෙන හා බෙල්ලන්බැඳිපැලැස්ස වැනි ස්ථානවලිනි. අනුරාධපුර යුගයේ ඇතැම් ස්ථානවලින් ලැබුණු බ්‍රාහ්මීය අක්ෂර ගණයට වැටෙන අක්ෂරවලින් යුතු සෙල්ලිපි ඉහත ප්‍රදේශයෙන්ද සොයාගෙන ඇති අතර ඇඹිලිපිටිය, කල්තොට ප්‍රදේශවලින්ද ලැබී ඇති අනිකුත් නටඹුන් වලින් ද රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති ඓතිහාසික වටිනාකම පැහැදිලි වේ. මහනුවර යුගය වනවිට රත්නපුර දිස්ත්‍රික්කයේ කෝරළ 06 කට බෙදී තිබූ බව පෙනේ. ඒවා නම් කුරුවිට, නවදුන්, අටකලන්, කුකුළු, කඩවත්මැද හා කොලොන්න කෝරළ වේ. රත්නපුර දිස්ත්‍රික් කොඩිය කසාවන් මුතුපාට කොඩියකි. සබරගමුවේ පුරාණ කොඩියෙන් සකස් කර ගන්නා ලද මෙහි විසිතුරු රතු දාරයක් ද කසාවන් පසු තලයක්ද ඇත්තේය. කසා වර්ණය මහ සමන් දිවිය රාජයාණන්ට කැපකරන ලද වර්ණය වේ.

දිස්ත්‍රික්කයේ ඇති ප්‍රධාන පූජනීය ස්ථානය ශ්‍රී පාදස්ථානය වේ. අවුරුද්දේ උඳුවප් පොහොය දිනෙන් ඇරඹෙන ශ්‍රී පාද වන්දනා සමය ඊළඟ වසරේ වෙසක් පුර පසළොස්වක පොහොය දක්වා පවතී. දිවයිනේ සෑම ප්‍රදේශයකින්ම විශාල පිරිසක් මේ කාලය තුළ වන්දනාව සඳහා මෙම ස්ථානයට පැමිණෙති. රත්නපුර මහ සමන් දේවාලය ද එවැනි ඓතිහාසික වටිනාකමක් ඇති තවත් වැදගත් පූජනීය ස්ථානයකි. ජූලි හා අගෝස්තු මාස වලදී පැවැත්වෙන වාර්ෂික පෙරහැර සබරගමුව මහාසංස්කෘතික සංදර්ශනය ලෙස හැඳින්විය හැකිය. මේ හැරුණු විට දෙල්ගමුව රජමහා විහාරය, පොත්ගුල් විහාරය, අළුත්නුවර දේවාලය හා සංඛපාල රජ මහා විහාරය වැනි ආගමික අතින් වැදගත් ස්ථාන රාශියක් රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.ඓතිහාසික වශයෙන් මෙන්ම ආගමික හා සංස්කෘතික සහ පාරිසරික වශයෙන් වටිනාකමක් ඇති ආකර්ෂණීය මෙන්ම සුප්‍රසිද්ධ ස්ථාන දිස්ත්‍රික්කය පුරා විහිදී පැවතීම සංචාරක වටිනාකමක් එකතු කිරීමට සමත්ව ඇත. සිංහරාජ වනාන්තරය, උඩවලව ඇත් අතුරු සෙවන, වවුල්පන හිරිගල් ගුහාව, දර්ශනීය දිය ඇලි යනාදියෙන් පාරිසරික වටිනාකමක් මෙන්ම සංචාරක ප්‍රදේශයක් වීමට බලපා ඇත.

දේශගුණික සහ පාරිසරික ලක්ෂණ

දිස්ත්‍රික්කයේ සාමාන්ය වාර්ෂික උෂ්ණත්වය 240C ත් 350C ත් අතර මට්ටමක පවතී. සාමාන්ය වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 3749.3 කි. එසේ වුව ද දිස්ත්‍රික්කයේ පිහිටීම අනුව දිවයිනේ දැකිය හැකි සියලු දේශගුණික කලාපවලට අයත් ලක්ෂණ දැකිය හැකිය. මෙරට උපරිම වර්ෂාපතනය ලැබෙන ප්‍රදේශවලින් සැලකිය යුතු ප්‍රමාණයක් රත්නපුර දිස්ත්‍රික්කයට අයත්ය. මැයි සිට සැප්තැම්බර් දක්වා නිරිත දිග මෝසමෙන් දිස්ත්‍රික්කයේ තෙත් කලාපයට අයත් ප්‍රදේශවලට අධික වර්ෂාපතනයක් ලැබෙන අතර එම කාල සීමාව තුළදී මෙම ප්‍රදේශ ගංවතුර තර්ජනයට ලක්වේ. විශේෂයෙන්ම 2017 වසරේදී විශාල වශයෙන් ගංවතුර සහ නායයාම් ආදී ආපදා සිදු වූ අතර එම වසරේදී මැයි මාසයේදී පමණක් මි.මී. 1000කට ආසන්න වර්ෂාපතනයක් ලැබී ඇත. නොවැම්බර් සිට පෙබරවාරි මාසය දක්වා වූ ඊසාන දිග මෝසම් සුළඟින් ඇඹිලිපිටිය, කල්තොට වැනි වියළි කලාපය ලෙස ගැනෙන ප්‍රදේශවලට වර්ෂාව ලැබේ. සමනල කඳු ආශ්‍රිත ප්‍රදේශවලදී ඉතා අඩු උෂ්ණත්වයකුත් වියළි කලාපීය ප්‍රදේශවලදී ඉහළ උෂ්ණත්වයකුත් පෙන්වන මෙම දිස්ත්‍රික්කය තුළ දැඩි උෂ්ණත්ව විචලතාවක් ද පෙන්නුම් කරයි. පරිපාලනමය වශයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 18 කින් සමන්විත රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව 575 කි. පළාත් පාලන ආයතන අනුව මහ නගරසභාවක්, නගර සභා 02 ක් සහ ප්‍රාදේශීය සභා 14 ක් ඇත. තවද මැතිවරණ කොට්ඨාස 08කින් සමන්විත වන අතර නියෝජනය වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ගණන 11කි. මීට අමතරව දිස්ත්‍රික්කය නියෝජනය කරනු ලබන පළාත් සභා මන්ත්‍රී ආසන ගණන 22 කි.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යය වන්නේ දිස්ත්‍රික්කයේ රාජ්ය කටයුතු ක්‍රියාත්මක කිරීමයි. ඒහිදී පළාත් සභාව සමඟ සෘජු සම්බන්ධීකරණයක් පවත්වාගෙන යමින් එක් එක් අංශ වෙත ලැබෙන ප්‍රතිපාදන මඟින් දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඵලදායී ලෙස ඉහළ නැංවීමට ක්‍රියා කිරීම සිදු කරනු ලබයි.

1. 2 ආයතනයේ දැක්ම / මෙහෙවර / අරමුණ

දැක්ම

“යහපාලනය තුළින් සමෘද්ධිය”

මෙහෙවර

ප්‍රාදේශීය ලේකම් කාර්යාල, අනෙකුත් රජයේ ආයතන, පුද්ගලික අංශය හා රාජ්‍ය නොවන අංශය ද ක්‍රියාකාරී ලෙස සහභාගී කර ගනිමින් රාජ්‍ය ප්‍රතිපත්ති හා වැඩසටහන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම තුළින් රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීම

අරමුණ

දිස්ත්‍රික්කය තුළ සියලුම රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වල නියෝජ්‍ය ආයතනය ලෙස ක්‍රියාකරමින් ඒ ඒ දෙපාර්තමේන්තු වල අරමුණු, පරමාර්ථ හා කාර්යයන් ඉටු වන පරිදි සම්බන්ධීකරණ කටයුතු කිරීම

1.3 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන් :

1. රජයේ කාර්යයන් සම්බන්ධීකරණය කිරීම.
2. ගම් මට්ටමින් හා ප්‍රාදේශීය මට්ටමින් නිලධාරීන් හා සංවිධාන මාර්ගයෙන් නීතියෙන් පවරා දී ඇති කාර්යයන් සාධනය කිරීම
3. වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස කටයුතු කිරීම
4. විවිධ ශීර්ෂයන්ට අදාළ ආදායම් එකතු කිරීම
5. විමධ්‍යගත අයවැය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
6. පළාත් සභාවට ඒවායේ කටයුතුවලදී සහාය වීම
7. ජාතික මට්ටමේ සහ දිස්ත්‍රික් මට්ටමේ සංස්කෘතික, ආගමික හා වෙනත් කාලීන රාජ්‍ය උත්සව සංවිධානය කිරීමේ ප්‍රධාන ආයතනය ලෙස ක්‍රියාකිරීම.
8. සියලුම මැතිවරණ කටයුතු වලදී මැතිවරණ කොමිෂන් සභාවේ නියෝජිත ආයතනය ලෙස ක්‍රියාකිරීම.
9. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, කෘෂිකර්ම කමිටුව, පරිසර කමිටුව, පෝෂණ කමිටුව, ඩෙංගු මර්ධන කමිටුව, නිවාස කමිටුව යන කමිටු පැවැත්වීම මගින් දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සැලසුම් කිරීම, සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.
10. දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 ක සහ ග්‍රාම නිලධාරි කාර්යාල 575 ක පරිපාලන කටයුතු අධීක්ෂණය කිරීම.
11. විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සම්බන්ධ ආදායම් ගණන් දීමේ නිලධාරීන් වෙනුවෙන් ඔවුන්ගේ ආදායම් රැස් කිරීම, ගිණුම් ගත කිරීම, භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම හා අදාළ ආදායම් ගණන් දීමේ නිලධාරීන් දැනුවත් කිරීම.
12. දිස්ත්‍රික්කය තුළ සියලුම රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වල නියෝජිත ආයතනය ලෙස ක්‍රියාකරමින් ඒ ඒ දෙපාර්තමේන්තු වල අරමුණු, පරමාර්ථ හා කාර්යයන් ඉටු වන පරිදි සම්බන්ධීකරණ කටයුතු කිරීම.
13. නියහ,ගංවතුර, සුළි සුළං, නාය යෑම් , නියහය වැනි විස්තීර්ණ ස්වාභාවික ආපදා අවස්ථාවන්හිදී රජයේ නියෝජිතයා ලෙස ක්‍රියාකරමින් ආපදා කළමනාකරණ කටයුතු සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය හා පසු විපරම් කටයුතු කිරීම හා ස්ථාවර කිරීම.
14. දිස්ත්‍රික්කය තුළ ඉඩම් ඔප්පු ලියා පදිංචි කිරීමත්, උප්පැන්න, මරණ සහ විවාහ ලියා පදිංචි කිරීමේ ඡායා පිටපත් නිකුත් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
15. දිස්ත්‍රික්කය තුළ විශ්‍රාම වැටුප් වැඩසටහන සම්බන්ධීකරණය කිරීම.
16. මහජන දුක්ගැනවිලි සඳහා ඵලදායි ප්‍රතිචාරාත්මක ආයතනයක් ලෙස කටයුතු කිරීම.
17. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනතේ විධි විධාන ක්‍රියාත්මක වන පොදු අධිකාරියක් ලෙස ක්‍රියාකිරීම.

1.4 ආයතනික ව්‍යුහය-සංවිධාන සටහන




සිතියම් අංක 01: සාපේක්ෂ සහ නිරපේක්ෂ පිහිටීම
රත්නපුර දිස්ත්‍රික්කය
කොළඹ
කෑගල්ල
නුවරඑළිය
බදුල්ල
කළුතර
මොණරාගල
ගාල්ල
මාතර
හම්බන්තොට
N
0 5 10 20 කි.මී.
සිතියම් අංකය
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
1 ඇහැළියගොඩ
2 කුරුවිට
3 කිරිඇල්ල
4 රත්නපුර
5 ඉඹුල්පේ
6 බලංගොඩ
7 කල්තොට
8 ඕපනායක
9 පැල්මඩුල්ල
10 ඇලපාත
11 අයගම
12 කලවාන
13 නිවිතිගල
14 කහවත්ත
15 ගොඩකවෙල
16 වැලිගෙපොල
17 ඇඹිලිපිටිය
18 කොලොන්න
සුචිය
දිස්ත්‍රික් මායිම
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මායිම
ප්‍රා. ලේ. කාර්යාලවල පිහිටීම

දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලනයේ සුවිශේෂිතා - 2022 වර්ෂය

රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඩම් භාවිතය

	ඉඩම් වර්ගය	භූමි ප්‍රමාණය (හෙක්)	%
1	ගොඩබිම් ප්‍රමාණය	324,045	99%
2	අභ්‍යන්තර ජලාශ	3,455	1%
	මුළු බිම්ප්‍රමාණය	**327,500**	**100%**
1	වගා කළ මුළුබිම් ප්‍රමාණය	205,412	63%
2	වගා නොකළමුළු බිම් ප්‍රමාණය	43,670	13%
3	වනාන්තර මුළු බිම් ප්‍රමාණය	78,418	24%
	මුළු භූමිප්‍රමාණය	**327,500**	**100%**

දිස්ත්‍රික්කයේ ඉඩම් පරිහරණ රටාව

අංකය	විස්තරය	ප්‍රමාණය (හෙක්)	%
1	අස්වද්දන ලද කුඹුරු	18,608	6%
2	තේ	48,602	15%
3	රබර්	38,252	12%
4	පොල්	6,142	2%
5	කුරහු	1,550	0%
6	වෙනත් වගාවන්	18,354	6%
7	වනාන්තර		
	1. ඝන වනාන්තර	59,971	18%
	2. විවෘත වනාන්තර	13,942	4%
	3. වන වගා	4,505	1%
8	ලඳු, කැලෑ හා තේන්	30,900	9%
9	ගෙවතු	72,284	22%
10	වගුරු බිම්	133	0%
11	ජලාශ	3,362	1%
12	මුඩු බිම් හා අන්තරින ලද ඉඩම	2,849	1%
13	වෙනත් ජලකලයන්	2,947	1%
14	වෙනත් (ප්‍රජා භූමි,මාර්ග , සුසාන භූමි)	1,652	1%
15	වැලි හා ගල්පර	3,447	1%
	එකතුව	**327,500**	**100%**

අංකය	විස්තරය	ප්‍රමාණය	
1	මුළු ජනගහනය	1,190,059	
2	ප්‍රාදේශීය ලේකම් කාර්යාල	18	
3	ග්‍රාම නිලධාරී වසම්	575	
4	ගම්මාන සංඛ්‍යාව	1,943	
5	ලියාපදිංචි ජන්ද දායකයින් සංඛ්‍යාව	902,996	
6	ජන්ද කෙටියාශ සංඛ්‍යාව	699	
7	ප්‍රාදේශීය පළාත් පාලන ආයතන	19	
8	මහ නගර සභා	1	
9	නගර සභා	2	
10	ප්‍රාදේශීය සභා	14	
11	ජානික පාසැල් සංඛ්‍යාව	14	
12	පළාත් සභා පාසැල්	39	
13	දිස්ත්‍රික් මහ රෝහල් සංඛ්‍යාව	1	
14	මූලික රෝහල්	4	
15	ප්‍රාදේශීය රෝහල්	32	
16	නගර සභා මාර්ග (කි.මී)	335	
17	ප්‍රාදේශීය සභා මාර්ග (කි.මී)	3,781	
18	පවුල් සංඛ්‍යාව	285,893	
19	කෘෂිකර්ම අංශය සේවා නියුක්තිය		42.80%
20	කර්මාන්ත අංශය සේවා නියුක්තිය		26%
21	සේවා අංශය සේවා නියුක්තිය		31.10%
	ආගමික/පෞරාණික ස්ථාන		
1	පන්සල්	818	
2	කෝවිල්	285	
3	මුස්ලිම් පල්ලි	63	
5	ක්‍රිස්තියානි දේවස්ථාන	77	
	දිස්ත්‍රික්කයේ පාසැල් පද්ධතිය		
1	අධ්‍යාපන කලාප	4	
2	අධ්‍යාපන කොට්ඨාශ	16	
3	පාසැල් සංඛ්‍යාව	598	

	පාසල් වර්ගය	සංඛ්‍යාව	ගුරුවරු සංඛ්‍යාව	ශිෂ්‍ය සංඛ්‍යාව
1	ජානික පාසල් -1 ඒබී	14	1,788	35,361
2	පළාත් සභා පාසැල් -1 ඒබී	584	2,315	42,355
	1 ඒබී පාසල්	53	4,103	77,716
	1 සී පාසල්	94	3,306	55,548
	2 ශ්‍රේණිය පාසල්	254	4,509	55,502
	3 ශ්‍රේණිය පාසල්	197	1,885	35,152
	එකතුව	**598**	**13,803**	**223,918**

මූලාශ්‍රය - "ඉඩම් පරිහරණය හා භූමි ආවරණය" ග්‍රන්ථය -ඉඩම් පරිහරණ සැලසුම් අංශය

1.5 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන අංශ

1. කළමනාකරණ අංශය

i. දිස්ත්‍රික් පරිපාලන කටයුතු
ii. මානව සම්පත් කළමනාකරණ කටයුතු

2. **ගිණුම් අංශය** (මූල්‍ය කළමනාකරණ කටයුතු,අක්මුදල් සැලසුම් හා වාර්ෂක ප්‍රසම්පාදන සැලසුම්,ගබඩා කටයුතු)

03. දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අංශය (සංවර්ධන /ආයතන /වතු කටයුතු)

04. අභ්‍යන්තර විගණන අංශය

05. ඉංජිනේරු අංශය

06. සමෘද්ධි අංශය

07. දිස්ත්‍රික් කෘෂිකර්ම අංශය

08. සංඛ්‍යා ලේඛන අංශය

09. විමර්ශන අංශය

10. සමාජ සංවර්ධන අංශය

I. සංස්කෘතික කටයුතු
II. සමාජ සේවා කටයුතු
III. බෞද්ධ කටයුතු
IV. දිස්ත්‍රික් ඵලදායිතා කටයුතු
V. ක්‍රීඩා කටයුතු
VI. ළමා සංවර්ධන කටයුතු (ළමා හිමිකම් / මනෝ සමාජීය)
VII. රාජ්‍ය නොවන සංවිධාන කටයුතු
VIII ආපදා කළමනාකරණ අංශය
VIII. ආපදා සහන සේවා කටයුතු
IX. අන්තරායකර ඖෂධ පාලන කටයුතු
X. භාෂා පරිවර්ථන කටයුතු
XI. කාන්තා කටයුතු
XII. මානව සම්පත් සංවර්ධන කටයුතු
XIII. විදේශ රැකියා කටයුතු
XIV. දිස්ත්‍රික් විදාතා කටයුතු

11. ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් අංශය

12. මෝටර් රථ ප්‍රවාහන දිස්ත්‍රික් කාර්යාලය

13. දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් අංශය

14. ජාතික ළමාරක්ෂක අධිකාරිය

15. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

16. කාර්මික සංවර්ධන මණ්ඩලය

17. සමාජ ආරක්ෂණ මණ්ඩලය

18. කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය

19. මිණුම් ඒකක හා ප්‍රමිත සේවාඅංශය

20. මාධ්‍ය අංශය

21. දිස්ත්‍රික් බහුකාර්ය සංවර්ධන අංශය

22. ප්‍රාදේශීය පරිපාලනය

.....//.....

1.6 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී වසම්

අනු අංකය	ප්‍රා.ලේ.කොට්ඨාශ අංකය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	ජන්ද කොට්ඨාස සංඛ්‍යාව	ගම් සංඛ්‍යාව	ග්‍රාම නිලධාරී වසම් ගණන
1	**9103**	ඇහැලියගොඩ	18	96	44
2	**9106**	කුරුවිට	26	85	39
3	**9109**	කිරිඇල්ල	14	35	17
4	**9112**	රත්නපුර	22	160	53
5	**9115**	ඉඹුල්පේ	13	252	50
6	**9118**	බලංගොඩ	06	206	41
7	**9121**	ඕපනායක	21	119	20
8	**9124**	පැල්මඩුල්ල	21	111	37
9	**9127**	ඇලපාත	10	68	20
10	**9130**	අයගම	10	67	21
11	**9133**	කලවාන	14	125	33
12	**9136**	නිවිතිගල	9	82	24
13	**9139**	කහවත්ත	16	54	21
14	**9142**	ගොඩකවෙල	10	62	44
15	**9145**	වැලිගෙපොල	8	138	30
16	**9148**	ඇඹිලිපිටිය	17	107	40
17	**9151**	කොලොන්න	10	123	29
18		කල්තොට	04	53	12
එකතුව			**249**	**1943**	**575**

➢ රත්නපුර දිස්ත්‍රික්කයේ මැතිවරණ කොට්ඨාස

අනු අංකය	මැතිවරණ කොට්ඨාසය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
01	රත්නපුර	රත්නපුර, කුරුවිට
02	ඇහැලියගොඩ	ඇහැලියගොඩ, කිරිඇල්ල
03	කලවාන	කලවාන, අයගම
04	බලංගොඩ	බලංගොඩ,ඉඹුල්පේ
05	පැල්මඩුල්ල	පැල්මඩුල්ල, රත්නපුරෙන් කොටසක්
06	රක්වාන	ඕපනායක, ගොඩකවෙල, වැලිගෙපොල
07	නිවිතිගල	නිවිතිගල, ඇලපාත, කහවත්ත
08	කොලොන්න	කොලොන්න, ඇඹිලිපිටිය

1.7 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ආයතන /අරමුදල් - අදාළ නැත

1.8 විදේශීය අරමුදල් සැපයෙන ව්‍යාපෘති වල විස්තර - අදාළ නැත

02 - පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ජයග්‍රහණ / අභියෝග /ඉදිරි ඉලක්ක

2.2.1. ලබාගත් ජයග්‍රහණ

01. මානව සම්පත් කළමනාකරණය

- කාර්ය මණ්ඩල පුහුණු කිරීම්
- පළදායිතා කව (දිස්ත්‍රික් / **ප්‍රාදේශීය**) මට්ටමින් දියත් කිරීම
- **දිස්තික් පරිපාලන ගැටළු විසඳීම**

කාරණය	වැඩ සටහන	ප්‍රගතිය/ක්‍රියාමාර්ග
01. මහජනතාවගේ ඉල්ලීම්/ දුක්ගැනවිලි/ ලිපි සම්බන්ධයෙන් ගත් කඩිනම් ක්‍රියාමාර්ග	මහජන පැමිණිළි ගණන -245 2022 වර්ෂයේ ඉඩම් ගැටළු - 332	2022 වර්ෂයේ අවසන් කර ඇති පැමිණිලි ගණන-165 අවසන් කර ඇති ඉඩම් ගැටළු ගණන -182
02. වර්ෂයේ විගණන වාර්තා	විගණන වාර්තා ගණන -39	පිළිතුරු සැපයූ ගණන-35 අතුරු පිළිතුරු - 01
03. ප්‍රාදේශීය පරිපාලනය සහ අධීක්ෂණය වැඩිදියුණු කිරීම	දැක්ම හා මෙහෙවර	ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට පොදු දැක්මක් සකස් කිරීම
04. රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීමේදී සාකච්ඡාවූ මෙතෙක් නොවිසඳුනු කරුණු	කුරුවිට ප්‍රා.ලේ.නිල නිවස අළුත්වැඩියාව	විනය පරීක්ෂණ වාර්තාව අනුව කාර්මික නිලධාරී වේදනා වළින් නිදහස් කර ඇත.
	සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම	ඉඹුලපෙ/ගොඩකවෙල/ඕපනායක/වැලිගෙපොල/කොලොන්න වර්තමාන තත්ත්වය පිළිබඳව අමාත්‍යාංශය දැනුවත් කර ඇත.

- **ප්‍රතිපත්ති සම්පාදන කටයුතු**

කමිටුව වර්ගය		පැවැත් වූ වාර ගණන	ප්‍රතිලාභීන් ගණන
I.	පොහොර සම්බන්ධීකරණ කමිටුව	**03**	**130**
II.	ජල කළමනාකරණ කමිටුව	02	**0**
III.	මිළ කමිටුව	**07**	**30 ප්‍රා.ලේ. 18 ඇතුළුව**
IV.	දිස්.ළමා සංවර්ධන කමිටුව	**03**	**125**
V.		**දිස්ත්‍රික්** -02 **ප්‍රාදේශීය** -03 **ග්‍රාමීය** - 01	128 267 50
VI.	වන අලි කමිටුව	**03**	**16**
VII.	ආහාර සුරක්ෂිතතා හා පෝෂණ දිස්ත්‍රික් ඒකාබද්ධ යාන්ත්‍රණය	**දිස්ත්‍රික් -03** **ප්‍රාදේශීය -18** **ග්‍රාමීය - 575**	**නිලධාරීන් -96** **සාමාජිකයින් -2744** **සාමාජිකයින් -5569**
VIII.	නිවාස කමිටුව	**01**	**0**
IX.	සීමා නිරණ කමිටුව	**05**	**92**
X.	දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව	**02**	**102**
XI.	**කෘෂිකර්ම කමිටුව**	**12**	**55**

- **වර්ෂය තුළ ලබාදුන් ජාතික හැඳුනුම් පත් හා ග්‍රාම නිලධාරී සහතික හා උපත් /විවාහ/මරණ ලියාපදිංචි කිරීම්**

අනු අංකය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	ජාතික හැඳුනුම්පත් සංඛ්‍යාව	ග්‍රාම නිලධාරී සහතික සංඛ්‍යාව	ලියා පදිංචි උපත් සංඛ්‍යාව	නිකුත් කල උප්පැන්න සහතික පිටපත් සංඛ්‍යාව	ලියාපදිංචි කරන ලද විවාහ සංඛ්‍යාව	නිකුත් කරන ලද විවාහ සහතික පිටපත් සංඛ්‍යාව	ලියාපදිංචි කරන ලද මරණ සංඛ්‍යාව	නිකුත් කරන ලද මරණ සහතික පිටපත් සංඛ්‍යාව
1	අයගම	749	3320	0	4346	126	447	164	208
2	බලංගොඩ	1738	10300	22	19696	519	2023	302	402
4	ඇඹිලිපිටිය	5960	21100	3617	35125	902	1891	1136	2007
5	ඇහැලියගොඩ	1,092	7,309	4	13,309	476	1,510	431	519
6	ඇලපාත	879	3028	0	6125	296	741	180	252
7	ගොඩකවෙල	1300	8817	10	10467	474	1332	398	450
8	ඉඹුල්පේ	1285	7739	2252	16123	300	1465	652	749
9	කහවත්ත	634	3,531	1,701	9,418	449	767	566	396
10	කලවාන	1182	4907	46	9808	360	792	301	257
11	කල්තොට	96	0	0	198	0	80	0	73
12	කිරිඇල්ල	701	3562	7	6198	205	575	154	220
13	කොලොන්න	738	5737	11	5536	352	944	288	279
14	කුරුවිට	2201	12000	1	11988	811	2115	436	497
15	නිවිතිගල	810	5,173	12	6,604	287	837	282	304
16	ඕපනායක	1287	2876	0	5584	11	527	11	239
17	පැල්මඩුල්ල	2214	7696	3	15734	568	1810	487	694
18	රත්නපුර	3098	15500	5994	57129	820	5800	2878	3805
19	වැලිගෙපොල	654	2513	1	4302	214	582	136	121
එකතුව		**26,618**	**125,108**	**13,681**	**237,690**	**7170**	**24,238**	**8,802**	**11,472**

➢ ඉඩම් බලපත් හා ඔප්පු ලබාදීම

අනු අංකය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	මුළු බිම් ප්‍රමාණය (හෙක්/අක්/කිමී)	නිකුත් කරන ලද ඉඩම් බලපත්‍ර සංඛ්‍යාව	නිකුත් කරන ලද ඔප්පු ප්‍රමාණය	නිකුත් කරන ලද ඔප්පු පිටපත් සංඛ්‍යාව
1	අයගම	හෙක් .15170	109	30	0
2	බලංගොඩ	අක්51857රූඩ්01පර්05	91	25	0
3	ඇඹිලිපිටිය	හෙක් 38800	116	63	0
4	ඇහැලියගොඩ	හෙක් 14100	7	98	4
5	ඇලපාත	(හෙක්)8696	40	147	0
6	ගොඩකවෙල	(හෙක්) 2534	7	0	0
7	ඉඹුල්පේ	256 වර්ග කි.මී.	0	83	0
8	කහවත්ත	අක්.25497.5	43	33	0
9	කලවාන	(හෙක්)37900	8	0	12
10	කල්තොට	ව.කි.මී93900	1	48	0
11	කිරිඇල්ල	(හෙක්) 1647.41	15	0	0
12	කොලොන්න	(හෙක්) 6737.0645	0	0	0
13	කුරුවිට	(හෙක්)17449.41	85	54	0
14	නිවිතිගල	153.93වර්ග කිමී	0	0	0
15	ඕපනායක	හෙක්.7464	60	104	0
16	පැල්මඩුල්ල	හෙක්.14,674	147	105	0
17	රත්නපුර	හෙක්.32,400	195	12	0
18	වැලිගෙපොල	හෙක්.20093.99	48	104	0
එකතුව			**972**	**906**	**16**

මූලාශ්‍රය - ජන හා සංඛ්‍යාලේඛණ අත්පොත / අදාල ප්‍රා.ලේ.කා.

➢ වර්ෂය පුරා පැවති සැමරුම් උත්සව/විවෘත කිරීම් /වැඩමුළු පැවැත්වීම් හා ක්ෂේත්‍ර පරීක්ෂාවන් :

01.)

අනු අංකය	සැමරුම් උත්සවය/විවෘත කිරීම් / වැඩමුළු	ස්ථානය
01	ජාතික පාසැල් 1000 ඉහළ නැංවීමේ සමාරම්භක උත්සවය	කුරුවිට මධ්‍ය මහා විද්‍යාලය
02	"මිහිඳු උදානය "වෙක්පත් බෙදාදීමේ උත්සවය	පළාත් ගුවනාගාරය
03	කුරගල පුදබිම හා කල්තොට සංවර්ධන ව්‍යාපෘති පරීක්ෂාව	කුරගල /කල්තොට
04	රාජ්‍ය වෙසක් උත්සවය පිළිබඳ සාකච්ඡාව	කුරගල පුදබිම
05	සිරිපා කරණ්ඩ වැඩසටහන හා ව්‍යාපෘති පරීක්ෂණය	සමන් දේ/රත්නපුර/ඇහැලියගොඩ/කුරුවිට
07	තෛපොංගල් උත්සවය පළාත් සභාව හා එක්ව	දි.ලේ.කා.පරිශ්‍රය
08	රත්නපුර නගර සංවර්ධන සැලැස්ම	ක්ෂේත්‍ර පරීක්ෂාව
09	74 වෙනි නිදහස්උත්සවය පිළිබඳ සාකච්ඡාව	දි.ලේ.කා.පරිශ්‍රය
10	දිස්ත්‍රික් කෘෂි කමිටුව හා පරිසර අමා.ලේකම්ගේ සාකච්ඡාව	දි.ලේ.කා.පරිශ්‍රය
11	එන්නත්කරණය වර්ෂපූර්ණය	දි.ලේ.කා.පරිශ්‍රය
12	ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ නගර රැස්වීම	ඇඹිලිපිටිය ප්‍රා.ලේ.කා.
13	කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳ සාකච්ඡාව	දි.ලේ.කා.පරිශ්‍රය
14	ජීවනෝපාය සංවර්ධනයෝ වැඩසටහන පිළිබඳ සාකච්ඡාව	දි.ලේ.කා.පරිශ්‍රය
15	යල කන්නයේ පොහොර වැඩසටහන පිළිබඳ සාකච්ඡාව	හරිත කෘෂිකර්. මධ්‍යස්ථානය රාජගිරිය
16	කාන්තා දින වැඩසටහන	දි.ලේ.කා.පරිශ්‍රය
17	හෘද රෝග ඒකකයට මුල්ගල තැබීමේ උත්සවය	රත්නපුර රෝහල/ගලදාරි හොටලය
18	දිස්ත්‍රික් ලේකම් කාර්යාල ආපදා කළමනාකරණ කමිටුව	දි.ලේ.කා.පරිශ්‍රය
19	නිපුනතා පාසැල් අනුකමිටු වැඩසටහන	දි.ලේ.කා.පරිශ්‍රය
20	ඇලලෙවැව ඉදිකිරීම් පරීක්ෂාව	පනාමුර-ඇඹිලිපිටිය ප්‍රා.ලේ.කා
21	"සුරකිමු ගංගා" කමිටු වැඩසටහන	දි.ලේ.කා.පරිශ්‍රය
22	ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ වැඩමුළුව	පළාත් සභාව හා ඒකාබද්ධව
23	ළමා සංවර්ධන/පෝෂණ/සෞඛ්‍ය වැඩසටහන්	ප්‍රාදේශීය කාර්යාලයීය මට්ටමින්
24	"හරිතදැයක්" ජාතික ගෙවතු වගා වැඩසටහන සමාරම්භක උත්.	බොරාගල කෘෂි විද්‍යාලය, පැල්මඩුල්ල
25	ග්‍රාම නිළධාරී කළමනාකරණ තරහයේ සහනික පත් ප්‍රධානය	දි.ලේ.කා.පරිශ්‍රය
26	"රණවිරු" උපහාර උත්සවය	නවනගරය/කුරගල
27	මහජන දින/ආපදා රාජකාරී පිළිබඳ ප්‍ර.ලේ.නි.දැනුවත් කිරීමේ වැඩ	දි.ලේ.කා.පරිශ්‍රය
28	ඉඩම් ගැටළු පරීක්ෂාව/විනය පරීක්ෂන	දි.ලේ.කා.පරිශ්‍රය
29	සමාජ පුතිලාභ මණ්ඩලයේ/ආර්ථික පුනර්ජීවන කේන්ද්‍ර සාකච්ඡාව	දි.ලේ.කා.පරිශ්‍රය
30	පොලිස් නිලධාරීන්ගේ ආතති කළමනාකරණ වැඩසටහන	දි.ලේ.කා.පරිශ්‍රය
31	දිසාපති සමුළුව/මැතිවරන කටයුතු පිළිබඳ සාකච්ඡාව	දි.ලේ.කා.පරිශ්‍රය

අනු අංකය	වැඩසටහන්	ස්ථානය
01	74 වන ජාතික නිදහස් උත්සව කටයුතු හා ව්‍යාපෘති කටයුතු	රත්නපුර සීවලී ක්‍රීඩාංගනය
02	නිදහස් උත්සවයට සමගාමීව රුක් රෝපණ වැඩසටහන	කොලොන්න ප්‍රා.ලේ./උල්ලිදුවාව රක්ෂි.
03	ගම සමඟ පිළිසඳර වැඩසටහනෙහි ප්‍රගතිය පරීක්ෂාව	ඉඹුල්පෙ රාවනාකන්ද
04	රත්නපුර නගර සංවර්ධන වැඩසටහන	නාගරික සං. අමාත්. /ස්ව. කටය. අමාත.
05	ලෝක වනාන්තර දින රාජ්‍ය වැඩසටහන	ලෝක උරුම සිංහරාජය-කුඩාව
06	පල්ලෙකඩ කෙටල ඉවත් කිරීමේ වැඩසටහන හ/ පිටකන්ද කිතුල් ගම්මානය විවෘත	අයගම ප්‍රා.ලේ.කාර්යාලය
07	ශ්‍රී පාද මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු	ඉදිකටුපාන සිට ශ්‍රී පාද මළුව දක්වා
08	ආර්ථික මධ්‍යස්ථාන/ප්‍රජා ජලපහසුකම්/ආපදා කලමනාකරන වැඩසටහන්	කුරුවිට/ඇලපාත/රත්නපුර/කිරිඇල්ල ප්‍රා.ලේ.කා.
09	ගංවතු ආපදා වැඩසටහන්	කුරුවිට/ඇලපාත/රත්නපුර/කිරිඇල්ල
10	පුපුරණ ද්‍රව්‍ය ගබඩා කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව හා ඔක්ස් ගුදම් භාණ්ඩ බෙදාදීම හා ආර්ථික මධ්‍යස්ථාන පරීක්ෂාව	ඇඹිලිපිටිය ප්‍රා.ලේ.කා.
14	කල්තොට-වම්ඉවුර කන්න මූල රැස්වීම්	කල්තොට ප්රා.ලේ.
15	ආහාර සුරක්ෂිතතා වැඩසටහන	දි.ලේ.කා.පරිශ්‍රය
17	දහම් ගුරුනිවාස වැඩසටහන ප්‍රගති පරීක්ෂාව	ඉඹුල්පෙ/වෙහෙරගොඩ/කුරගල පුදබිම
18	අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා /ඉන්ධන බෙදාහැරීම	බලංගොඩ ප්‍රා.ලේ.කා
19	ලොක ආහාර වැඩසටහනෙහි සාකච්ඡාව හා කව තරඟය	දි.ලේ.කා.පරිශ්‍රය
20	ඇසිදිසි මහා සෑයේ කොත් පැලඳීමේ උත්සවය	කුරගල/ඇලපාත කාර්යාලය
21	පුපුරණ ද්‍රව්‍ය ගැටළු පරීක්ෂණය	දි.ලේ.කා.පරිශ්‍රය
22	‘’’එක්ව වවමු’’’ කෘෂිකාර්මික online වැඩසටහන	දි.ලේ.කා.පරිශ්‍රය
23	ගංවතුරින් නායගිය ස්ථාන පරීක්ෂාව	කුරුවිට/අයගම/රත්නපුර/කිරිඇල්ල /බලංගොඩ
24	ඉන්දියානු මානුෂීය ආධාර බෙදාදීමේ වැඩසටහන	කුරුවිට කිරගල වත්ත
25	ලේ දන්දීමේ වැඩසටහන	දි.ලේ./ප්‍ර.ලේ මට්ටමින්
26	“මැග්ඩවුස් සුළිකුණාටු “ආපදා තත්ව පාලනය හා සහන සැලසීම	දි.ලේ.කාර්යාලය
27	රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීම්	දි.ලේ.කාර්යාලය



02. මූල්‍ය කළමනාකරණය

► අංශයේ ප්‍රගතිය

අනු අංකය	විෂයය	ප්‍රගතිය
01	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික අයවැය සකස් කිරීම	100%
02	විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීම	90%
03	ප්‍රසම්පාදන සහ ගබඩා කළමනාකරණ	100%
04	ආදායම් ගිණුම / අග්‍රිම ගිණුම/ අවසාන ගිණුම	100%
05	මාසික ගිණුම් සාරාංශය සකස් කිරීම	100%
06	තැන්පතු ගිණුම් ඉදිරිපත් කිරීම	100%
07	වෙනත් දෙපාර්තමේන්තු ගෙවීම්, ගිණුම් වාර්ථා මාසිකව, කාර්තු වශයෙන් ඉදිරිපත් කිරීම	95%
08	වැටුප් හා හිඟ වැටුප් ගෙවීම්	100%
09	දෙපාර්තමේන්තු පොත් සහ භාණ්ඩාගාර පොත් සැසඳීම	100%
10	අත්තිකාරම් ගිණුම/ පාලන ගිණුම	100%

► විශ්‍රාම වැටුප් ගෙවීම

අනු අංකය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	විශ්‍රාමිකයින් සංඛ්‍යාව	මුළු වියදම (රු.)
1	අයගම	447	315,645.00
2	බලංගොඩ	1800+194	830,245.00
4	ඇඹිලිපිටිය	2676	839,573.00
5	ඇහැලියගොඩ	1908	490,913.94
6	ඇලපාත	783	417,326.00
7	ගොඩකවෙල	1684	735,341.01
8	ඉඹුල්පේ	1319	297,894.16
9	කහවත්ත	584	143,589.60
10	කලවාන	817	790,948.80
11	කිරිඇල්ල	707	163,000.00
12	කොලොන්න	763	229,566.71
13	කුරුවිට	2474	480,320.00
14	නිවිතිගල	691	169,820.00
15	ඕපනායක	501	529,104.40
16	පැල්මඩුල්ල	1665	660,893.30
17	රත්නපුර	3530	1,059,126.74
18	වැලිගෙපොල	518	476,861.00
එකතුව		**23061**	**8,630,168.66**

► අතැනි බිල්පත් වාර්තාව -13.12.2022 දිනට

(රු.මිලියන)

අනු අංකය	වැය විෂය	වැඩසටහන	අතැනි බිල්පත් ප්‍රමාණය
පුනරාවර්තන			**7.83**
1	278-1-2-0-1409	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය රත්නපුර	0.34
2	278-1-1-6-1205		0.00
3	278-1-2-0-1404		0.02
4	278-1-2-0-1101		0.03
5	278-1-2-0-1101		0.28
6	278-1-2-0-1302		0.03
7	278-1-2-0-1301		0.00
8	278-1-2-0-1002		0.01
9	278-1-2-0-1402		0.03
10	101-2-6-0-1409	බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	0.05
11	103-2-18-0-1101	ආරක්ෂක අමාත්‍යාංශය	0.06
12	103-2-18-7-2506		1.29

13	110-1-5-0-1101	අධිකරණ අමාත්‍යාංශය	0.01
14	110-1-3-0-1409		0.55
15	130-1-5-0-1101	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය	0.01
16	130-1-17-0-1404		0.00
17	151-1-3-0-1101	ධීවර අමාත්‍යාංශය	0.02
18	171-02-08-03-1409	කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය	0.23
19	171-1-5-0-1101		0.28
20	171-2-6-0-1101		0.01
21	171-2-8-0-1101		0.01
22	193-1-14-1101	කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය(ජාතික ඵලදායිතා ලේකම් කාර්.)	0.01
23	194-2-7-8-1101	තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය	0.03
24	194-2-7-8-1409		0.24
25	201-2-2-13-1501	බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව	0.07
26	334-1-1-0-1002	බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව	0.00
27	217-2-2-0-1101	පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව	0.00
28	303-2-1-0-1501	ජේෂ කර්ම දෙපාර්තමේන්තුව	0.25
29	334-1-1-0-1003	බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව	3.80
30	334-1-1-0-1101	බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව	0.01
31	409-2-10-1-1501	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය	0.03
32	442-2-7-3-1508	ආරක්ෂක අමාත්‍යාංශය	0.13
ප්‍රාග්ධන			**72.45**
1	278-1-1-8-2509	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය රත්නපුර	6.60
2	001-2-6-13-2509	බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	5.05
3	103-2-18-05-2202	ආරක්ෂක අමාත්‍යාංශය	19.59
4	122-2-3-5-2105	ඉඩම් අමාත්‍යාංශය	28.41
5	171-2-3-4-2509	කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය	0.03
6	442-2-7-7-2506	ආරක්ෂක අමාත්‍යාංශය	0.19
7	පොදු තැන්පත් ගිණුම		12.59
එකතුව			**80.29**

03. ව්‍යාපෘති කළමනාකරණය

වර්ෂය පුරා පැවති ආර්ථික අර්බුදයත් සමග සමාජ හා ආර්ථික යටිතල පහසුකම් සඳහා සංවර්ධන හා පරිපාලන ඉලක්ක වෙත සාර්ථක ලෙස ළඟා වීමට නොහැකි තත්වයක් උද්ගතව පැවතිය ද සැලකිය යුතු ප්‍රතිපාදන ප්‍රමාණයක් ලබා ගැනීම සහ නියමිත පරිදි ඒම ප්‍රතිපාදන වියදම් කිරීමට හැකි වී ඇත.

- **දිස්ත්‍රික්කය සඳහා ආසන්න වසර 05 තුළ සිදුකර ඇති ප්‍රාග්ධන ආයෝජනය**

වගුව - 01



- **2021 වර්ෂයේ ආංශික ආයෝජන බෙදීයාම**

වගුව - 02



- **2022 වසරේ සමස්ත වැඩසටහන් /ව්‍යාපෘති වල ප්‍රගතිය :**

අනුමත ව්‍යාපෘති ගණන	*7,470*
අනුමත ප්‍රතිපාදනය	***රු.මී. 2,664.46***
නිමි ව්‍යාපෘති ගණන	***334***
වියදම	***රු.මී.151.53***
අතැති බිල්පත් වටිනාකම	***රු.මී. 5.36***
2022.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය	***6%***
2022.12.31 දිනට භෞතිකප්‍රගතිය	***4.50%***
මූලාශ්‍රය-සැලසුම් හා ක්‍රම සම්පාදන දිස්ත්‍රික් කාර්යාලය	

*(***2022.04.26 දිනැති භාණ්ඩාගාරයේ ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 ට අනුව ආරම්භ නොකළ වයාපෘති ක්‍රියාත්මක කිරීම නවතා ඇත)*

- **ආයෝජන ක්ෂේත්‍රය අනුව ප්‍රගතිය**

(රු.මිලියන)

අනු අංකය	ආයෝජන ක්ෂේත්‍රය	මූල්‍ය ප්‍රගතිය	(%) ගණන
1	මාර්ග	7,054.43	56.00
2	උසස් අධ්‍යාපනය සහ නිපුණතා සංවර්ධනය	1,401.95	11.00
3	ජල සම්පාදන සහ සනීපරක්ෂාව	692.07	5.50
4	සෞඛ්‍ය	677.45	5.40
5	කෘෂිකර්මය	659.87	5.20
6	සංස්කෘතික හා සමාජ සුභසාධනය	642.56	5.10
7	අධ්‍යාපන	640.76	5.10
8	වෙනත්	788.93	6.30
එකතුව		**12,558.02**	**99.6**

- **2022 වර්ෂයේ ප්‍රමුඛ ව්‍යාපෘතියක් වූ "ආහාර සුරක්ෂිතතා හා පෝෂණය සහතික කිරීම" මඟින් ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධනය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග :**

"ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන කේන්ද්‍ර සවිබල ගැන්වීමේ බහු ආංශික ඒකාබද්ධ යාන්ත්‍රණය" වැඩසටහන

- ආර්ථික අපහසුතාවයෙන් පෙළෙන තීව්‍ර මන්දපෝෂිත දරුවන්ගට අනුග්‍රාහකත්වය ලබා දීම
- ගෙවතු වගා ප්‍රවර්ධනය (ඒ සඳහා අප දිස්ත්‍රික්කය සතුව ගොවිපළ 04 ක් පවතී .)
- පාසල් දරුවන්ගේ ආහාර අනාරක්ෂිතභාවය අවම කිරීම.
- වගාවට යොදා නොගත් රාජ්‍ය ඉඩම් වගාවට යොදා ගැනීම
- ලෝක ආහාර වැඩසටහන - ii අදියර ක්‍රියාත්මක කිරීම
- "හරිත දැයක්" ගෙවතු වැඩසටහන
- හඳුනාගන්නා ලද 2023 වර්ෂයේ නිෂ්පාදන ඉලක්කයන් සඳහා ප්‍රමුඛතාවය ලබා දීම

▶ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මැදිහත්වීමෙන් ක්‍රියාත්මක කර ඇති වෙනත් වැඩසටහන් :

අනු අංකය	වැඩසටහන	වැඩසටහන් සංඛ්‍යාව	ප්‍රතිලාභීන් ගණන
1	ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා ආහාර මළු ලබා දීම	131	6,450
2	අවු. 05ට අඩු මන්දපෝෂිත දරුවන් සඳහා වියළි ආහාර මළු ලබා දීම	101	2,583
3	රක්තහීනතාවයෙන් පෙළෙන ගැබිනි මව්වරුන්ට ආහාර මළු ලබා දීම	29	846
4	පුනරුත්ථාපනය කරන ලද ඇළ මාර්ග හා වැව	44	2,461
5	ජීවනෝපාය සංවර්ධනය	1085	33,277
6	රැකියාගත කිරීම් - දේශීය / විදේශීය	255	2,077
7	ස්වයං ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ව්‍යවසායකයින් හඳුනා ගැනීම	156	2,032
8	පෝෂණය පිළිබඳ පවුල් ඒකක දැනුවත් කිරීම්	383	11,120
9	සෞඛ්‍ය උපදේශන වැඩසටහන්	664	18,714
10	ගෙවතු වගා ප්‍රවර්ධනය (හරිත දැයක් වැඩසටහනට අමතරව)	301	14,025
11	සුළු අපනයන බෝග වගා ප්‍රවර්ධනය	101	7,092
12	මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්	162	14,311
13	වෙනත්	334	15,225
එකතුව		**3,746**	**130,213**

ඇල්ලෙවැව ව්‍යාපෘතිය





ප්‍රමුඛ ව්‍යාපෘති ප්‍රගතිය - 2022.12.31 දිනට දිස්ත්‍රික්කයේ අංශ අතර ප්‍රගතිය

1. ක්‍රම සම්පාදන හා සැලසුම් අංශය

(රු.මිලියන)

අනු අංකය	වැඩසටහන	ප්‍රතිපාදන අමාත්‍යාංශය	වැය විෂයය	අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව	අනුමත ව්‍යාපෘති වටිනාකම	නිමි ව්‍යාපෘති සංඛ්‍යාව	2022.12.31 දිනට වියදම	2022.12.31 දිනට අතැති බිල්පත්	ප්‍රතිලාභීන්
1.1	ගම සමග පිළිසඳර - ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය (ග්‍රාම නිලධාරී වසමකට - රු.මි. 3 බැගින්)	රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු	278-1-1-08-2509-68	2693	969.83	143	76.35	0	38,014
1.2	ගම සමග පිළිසඳර - පළාත් පාලන ව්‍යාපෘතිය (කොට්ඨාශයකට- රු.මි.4 බැගින්)		278-1-1-08-2509-69	1308	525.53	58	32.84	0	
1.3	ගම සමග පිළිසඳර - ග්‍රාමීය ජීවනෝපාය සං. ව්‍යාපෘතිය (ප්‍රා. කමිටු රු.මි 100 - නියෝජිත රු.මි 20)		278-1-1-08-2509-71	1777	444.39	52	15.41	4.75	
2	විමධ්‍යගත අයවැය වැඩසටහන **		278-1-1-08-2509-70	1036	104.70	7	44.03	0	2,720
3.1	ඌන සංවර්ධන දහම් පාසැල් සංවර්ධනය	බුද්ධ ශාසන ,ආගමික කටයුතු හා සංස්කෘතික අමාත්‍යාංශය	201-2-2-8-2205	13	6.50	13	6.28	0	18,980
3.2	දුෂ්කර විහාරස්ථාන සනීපාරක්ෂක පහසුකම් සැපයීම වැඩසටහන			42	7.48	35	5.12		
3.3	ඌන සංවර්ධන විහාරස්ථාන සංවර්ධනය			4	1.93	4	1.90		
4	ගොවිපලෙන් බැහැර යටිතල පහසුකම් සංවර්ධනය	කෘෂිකර්ම අමාත්‍යාංශය		3	3.30	3	1.30	0	
5	යෝජිත ගෘහාශ්‍රිත වෙළඳ ඒකක (HOME SHOP) වැඩසටහන	සමූපකාර සේවා හා පාරිභෝගික ආරක්ෂණ	438-2-3-3-2509	575	575.00	0	0	0.60	
6	"හරිත දැයක් " වගා වැඩසටහන***	කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම	171-2-3-4-2509	18	24.30	18	24.30	0	
7	"සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන" වැඩසටහන	මුදල් අමාත්‍යාංශ	414-2-3-3-2509	1	1.50	1	1.40	0	
එකතුව				**7470**	**2664.46**	**334**	**208.93**	**5.35**	

** විමධ්‍යගත අයවැය වැඩසටහන සඳහා රු.මිලියන 42.6 ක 2021 වර්ෂයේ අතැති බිල්පත් ගෙවීම් ද ඇතුලත් කර ඇත.

*** *මෙම වියදම් ගම සමග පිළිසඳර වැඩසටහනින් රු.මි.17.89 ක් හා රු.මි.6.4 ක් කාන්තා හා ළමා කටයුතු අමා. මණින් දරා ඇත*

1. ගම සමග පිළිසඳර ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2 අදියර (ග්‍රාමීය සංවර්ධන /පළාත් පාලන/ ජීවනෝපාය)

අනු අංකය	ක්ෂේත්‍රය	සංඛ්‍යාව	භෞතික ප්‍රගතිය	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	ප්‍රතිලාභීන්
1	සංවර්ධනය කළ මාර්ග	93	දුර කි.මී.4.37	124.6	38,014
2	අධ්‍යාපන				
	ආරක්ෂිත වැට හා ගේට්ටු	8			
	ගොඩනැගිලි සංවර්ධනය කිරීම්	2			
	පුස්තකාල උපකරණ බෙදාදීම් පාසල්	2			
3	ආගමික හා සුභ සාධන	97			
4	සුළු වාරිමාර්ග	12			
5	වෙනත්	39			
එකතුව		253			

2. විමධ්‍යගත අයවැය වැඩසටහන -2022 වර්ෂයේ ප්‍රගතිය

අනු අංකය	ක්ෂේත්‍රය	ව්‍යාපෘති සංඛ්‍යාව	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	ප්‍රතිලාභීන්	වැඩ අවසන් වූ ව්‍යාපෘති වටිනාකම රු.මි.
1	ක්‍රීඩා පිටි	1	1.43	2720	0.03
2	ආගමික මධ්‍යස්ථාන	4			0.80
3	සුළු වාරිමාර්ග	1			0.50
4	අධ්‍යාපන	1			0.10
එකතුව		7			1.43

3. ආගමික සිද්ධස්ථාන සංවර්ධනය කිරීම -2022

අනු අංකය	ක්ෂේත්‍රය	අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව	අනුමත ව්‍යාපෘති වටිනාකම (රු.මිලියන)	නිමි ව්‍යාපෘති සංඛ්‍යාව	2022.12.31 දිනට වියදම (රු.මිලියන)	ප්‍රතිලාභීන්
1	ඌන සංවර්ධන දහම් පාසැල් සංවර්ධනය	13	6.5	13	6.28	18,980
2	දුෂ්කර විහාරස්ථාන සනීපාරක්ෂක පහසුකම් සැපයීම වැඩසටහන	42	7.48	35	5.12	
3	ඌන සංවර්ධන විහාරස්ථාන සංවර්ධනය	4	1.93	4	1.9	
එකතුව		59	15.91	52	13.3	

වැඩසටහන	නිමි ව්‍යාපෘති සංඛ්‍යාව	ප්‍රගතිය (%)
1. ගොවිපලෙන් බැහැර යටිතල පහසුකම් සංවර්ධනය	03	100
2. යෝජිත ගෘහ ආශ්‍රිත වෙළඳ ඒකක (HOME SHOP)		
වැඩසටහන	575	0
3. "සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන" වැඩසටහන	0	0

4. හරිත දැයක් වැඩසටහන - 2022

අනු අංකය	විස්තරය	වියදම (රු)	ප්‍රතිලාභීන්
1	තවාන් බීජ පැකට් සඳහා කෘෂිකර්ම දෙපා.වෙත ගෙවීම්	6,892,545.00	පවුල් 105,855
2	දිස්ත්‍රික් උත්සවයට ලබාගත් පළතුරු පැල සඳහා ගෙවීම්	8,000.00	
3	ප්‍රතිලාභීන් වෙත ලබා දෙන අයදුම්පත්‍රය මුද්‍රණය සඳහා ගෙවීම්	436,480.00	
4	එළවළු පැළ සඳහා ගෙවීම්	16,962,920.00	
එකතුව		24,299,945.00	

2. ගිණිඅවි හා පුපුරණ ද්‍රව්‍ය අංශය

▶ පුපුරණ ද්‍රව්‍ය නිකුත් කිරීම ප්‍රගතිය

අනු අංකය	විස්තරය	භෞතික	මූල්‍ය (රු.)
පුපුරණ ද්‍රව්‍ය			
1	පුපුරණ ද්‍රව්‍ය භාවිතය සඳහා අවසර පත් නිකුත් කිරීම	220	226,500.00
2	පුපුරණ ද්‍රව්‍ය සපයන්නාගේ බලපත් නිකුත් කිරීම	46	46,050.00
එකතුව		**266**	**272,550.00**
ගිණි අවි/ තුවක්කු			
1	2022 වර්ෂය සඳහා ගිණි අවි/තුවක්කු බලපත්‍ර අළුත් කිරීම (ජන.සිට සැප්. දක්වා)	803	105,700.00
	2023 වර්ෂය සඳහා ගිණි අවි/තුවක්කු බලපත්‍ර අළුත් කිරීම (ඔක්.සිට නොවැ. දක්වා)	502	72,800.00
2	2022 වර්ෂය සඳහා මුරකරු බලපත්‍ර නිකුත් කිරීම	168	1,680.00
3	ගිණි අවි සඳහා නව ඉල්ලීම් ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම	30	0
4	ගිණි අවි/ තුවක්කු ආපසු රජයට භාරදීම(2022 වර්ෂය)	21	0
එකතුව		**1524**	**180,180.00**

3. මෝටර් රථ අංශය

▶ මෝටර් රථ අංශයේ ප්‍රගතිය

අංකය	විස්තරය	සංඛ්‍යාව	මූල්‍ය ප්‍රගතිය(රු.)
1	නව රියදුරු බලපත් නිකුත් කිරීම	30,421	101,167,625.00
2	රියදුරු බලපත් අළුත් කිරීම	12,791	26,492,175.00
3	අනන්‍යතා සහතික නිකුත් කිරීම	326	61,750.00
4	වාහන පැවරීම	857	2,668,450.00
5	බර සහතික නිකුත් කිරීම	179	104,000.00
6	අංක තහඩු නිකුත් කිරීම	6,137	-
7	තහනම් නියෝග නිකුත් කිරීම	60	10,875.00
8	රියදුරු නව බදවා ගැනීම් හා කාර්යක්ෂමතා කඩඉම් විභාග	26	-
එකතුව		**50,797**	**130,504,875.00**

4. පාරිභෝගික කටයුතු අංශය

▶ පාරිභෝගික කටයුතු අංශය ප්‍රගතිය

කාර්යාලය /අංශය පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය	**2022 ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ 04 වන කාර්තුවට අදාළ ප්‍රගතිය (%)**	**2022 ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ වසර අවසාන ප්‍රගතිය (%)**
නඩු පැවරීම	105%	63.65%
මිල සමීක්ෂණ	100%	100%
සහන පැමිණිලි	100%	100%
උසාවි රාජකාරි	100%	100%
දැනුවත් කිරීම්	50%	50%

** **2022 වර්ෂයේ නිලධාරීන් කැඳවීම් සීමාකිරීම්/කොවිඩ් තත්වය/ඉන්ධන අර්බුධය/හේතුවෙන් ප්‍රගතිය 73% ක් තරම් විය.**

5. කුඩා කර්මාන්ත සංවර්ධන අංශය

අනු අංකය	ප්‍රධාන කාර්ය සාධන දර්ශක	වාර්ෂික ඉලක්කය	**2022.12.31** දිනට ප්‍රගතිය
1	නව ව්‍යාපාරයක් ආරම්භ කිරීම	230	159
2	පවතින ව්‍යාපාරයක් වැඩිදියුණු කිරීම	1380	330
3	ව්‍යාපාර උපදේශනය	184	186
4	වෙළඳපල සබඳතා	160	784
5	තාක්ෂණික පුහුණුව	322	631
6	ඇසුරුම්කරණය	184	147
7	ව්‍යාපාර ලියාපදිංචිය	230	370

6. සමෘද්ධි අංශය

▶ සමාජ ආරක්ෂණය

අනු අංකය	ප්‍රා.ලේ. කාර්යාලය	උපත් රු 10000		විවාහ රු 10000		රෝග		මරණ රු 20000		සිප්දොර 2019-2021		2020-2022		2021-2023		නිවුන් දරු උපත්		ස.අ.ලි.ගමන් වියදම්		3% කොමිස්	දින වැටුප් අතිකාල	එකතුව	
		ප්‍රමාණය	මුදල	ප්‍රමාණය	මුදල	ප්‍රමාණය	මුදල	ප්‍රමාණය	මුදල	ප්‍රමාණය	මුදල 1500	ප්‍රමාණය	මුදල 1500	ප්‍රමාණය	මුදල 1500	ප්‍රමාණය	මුදල	ප්‍රමාණය	මුදල	මුදල		ප්‍රමාණය	මුදල රු
1	අහැළියගොඩ	36	360,000	132	1,320,000	303	1,401,950	238	4,760,000	780	1,170,000	1,171	1,753,500	1,947	2,920,500	8	40,000	1	1,160.00	279,689.64	9,268.10	4,616	14,014,907.74
2	කුරුවිට	116	1,160,000	239	2,390,000	483	2,106,650	413	8,260,000	484	726,000	2,622	3,933,000	3,614	5,421,000	15	75,000	10	30,971.00	554,035.13	9,312.50	7,996	24,634,997.63
3	කිරිඇල්ල	53	530,000	111	1,110,000	247	980,900	158	3,160,000	500	750,000	1,162	1,743,000	1,523	2,284,500	6	30,000	1	2,975.00	214,460.33	7,040.96	3,761	10,809,901.29
4	රත්නපුර	70	700,000	218	2,180,000	409	1,779,750	372	7,440,000	498	747,000	2,530	3,795,000	2,634	3,951,000	2	10,000	4	12,360.00	423,551.48	13,737.75	6,737	21,040,039.23
5	ඉඹුල්පේ	45	450,000	153	1,530,000	288	1,202,250	252	5,040,000	230	345,000	2,374	3,561,000	3,208	4,812,000	-	-	-	-	306,685.40	-	6,550	17,246,935.40
6	බලංගොඩ	38	380,000	97	970,000	230	977,200	193	3,860,000	127	190,500	1,857	2,785,500	1,884	2,826,000	19	95,000	1	1,518.00	270,294.05	1,105.00	4,446	12,355,599.05
7	ඕපනායක	22	220,000	83	830,000	160	600,950	127	2,540,000	-	-	918	1,377,000	1,104	1,656,000	-	-	1	1,240.00	127,824.77	6,045.00	2,415	7,357,819.77
8	පැල්මඩුල්ල	97	970,000	241	2,410,000	385	1,898,750	421	8,420,000	582	873,000	4,420	6,630,000	4,068	6,102,000	10	50,000	8	20,560.00	609,661.14	10,728.50	10,232	27,974,139.64
9	ඇලපාත	75	750,000	134	1,340,000	299	1,220,900	168	3,360,000	306	459,000	1,572	2,358,000	2,010	3,015,000	3	15,000	-	-	248,965.94	5,828.00	4,567	12,772,693.94
10	අයගම	8	80,000	21	210,000	77	359,450	54	1,080,000	-	-	463	694,500	738	1,107,000	-	-	12	34,077.00	148,578.16	-	1,373	3,679,528.16
11	කලවාන	30	300,000	102	1,020,000	201	819,000	131	2,620,000	-	-	1,600	2,400,000	1,762	2,643,000	2	10,000	-	-	170,458.43	5,301.00	3,828	9,987,759.43
12	නිවිතිගල	36	360,000	164	1,640,000	319	1,229,250	204	4,080,000	1	1,500	1,622	2,433,000	1,857	2,785,500	5	25,000	1	1,140.00	275,275.37	-	4,209	12,829,525.37
13	කහවත්ත	45	450,000	144	1,440,000	141	561,750	166	3,320,000	234	351,000	1,087	1,630,500	1,681	2,521,500	-	-	3	43,330.00	233,278.17	-	3,501	10,508,028.17
14	ගොඩකවෙල	97	970,000	188	1,880,000	373	1,560,300	342	6,840,000	1,046	1,569,000	1,859	2,788,500	4,982	7,473,000	15	75,000	-	-	454,528.19	-	8,902	23,610,328.19
15	වැලිගෙපොල	52	520,000	103	1,030,000	187	647,850	133	2,660,000	194	291,000	1,613	2,419,500	1,908	2,862,000	3	15,000	11	11,000.00	188,966.37	11,375.50	4,204	10,645,691.87
16	ඇබිලිපිටිය	64	640,000	259	2,590,000	455	1,905,700	338	6,760,000	296	444,000	4,209	6,313,500	4,494	6,741,000	3	15,000	8	9,384.00	457,424.89	-	10,126	25,866,624.89
17	කොලොන්න	25	250,000	135	1,350,000	237	824,100	183	3,660,000	523	784,500	1,913	2,869,500	1,528	2,292,000	4	20,000	1	1,920.00	238,148.25	1,145.00	4,549	12,289,393.25
18	කල්තොට	27	270,000	34	340,000	91	336,700	58	1,160,000	-	-	600	900,000	702	1,053,000	-	-	1	1,000.00	37,624.61	-	1,513	4,097,324.61
	දි.ලේ.කා	-	-	-	-	-	-	-	-							-	-	-	-	274,520.00	2,307.24	-	276,827.24
එකතුව		936	9,360,000	2,558	25,580,000	4,885	20,413,400	3,951	79,020,000	5,801	8,701,500	33,592	50,385,000	41,644	62,466,000	95	475,000	63	172,635	5,513,970	83,195	93,525	261,998,065

සමෘද්ධි සහනාධාර දීමනා නිකුත් කිරීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාල උපරිම වාර්තාව2022 වර්ෂය- (2022.12.31 දිනට)

අනු අංකය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ජනවාරි		පෙබරවාරි		මාර්තු		අප්‍රේල්		මැයි		ජූනි		ජූලි		අගෝස්තු		සැප්තැම්බර්		ඔක්තෝම්බර්		නොවැම්බර්		දෙසැම්බර්		මුළු මුදල රු.මි
- කෙසේ වුවද මානව සම්පත කළමනාකරණය කර ගනිමින් දෙපාර්තමේන්තුවේ අරමුණු හා අභිමතාර්ථයන් සඵල කර ගැනීම සඳහා උපරිමයෙන් ප්‍රයත්න දරා ඇත.

6.3 ආයතනයේ කාර්යසාධනය සඳහා පුහුණු පාඨමාලා දායක වීම

- ආයතනයට ඔවුන්ගේ බලපෑම අනුව, සේවක පුහුණුවේ වැදගත්කම කළමනාකරුවන්ට පමණක් වැඩි වේ. ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමට, ඔවුන්ගේ සේවකයින් සංවර්ධනය කිරීමට, උපායශීලීව සිතීමට සහ අභියෝගවලට නම්‍යශීලීව ප්‍රතිචාර දැක්වීමට කළමනාකරුවන් පුහුණු කිරීමෙන් කණ්ඩායම් කාර්ය සාධනය සහ සේවක තෘප්තිය යන දෙකම විශාල ලෙස වැඩි කළ හැකිය.

- පුහුණුව සහ සංවර්ධනය ආයතනයක ඉහළ දක්ෂතා ලබා ගැනීමට සහ රඳවා ගැනීමට, රැකියා තෘප්තිය සහ චිත්ත ධෛර්යය වැඩි කිරීමට, ඵලදායිතාව වැඩිදියුණු කිරීමට සහ වැඩි ප්‍රගතියක් ලභාකර ගැනීමට උපකාරී වේ. මීට අමතරව, සක්‍රීයව උනන්දුවක් දක්වන සහ කැපවූ සේවකයින් සිටින ආයතනවල නොපැමිණීමේ අනුපාත සියයට 41 කින් අඩු වන අතර සියයට 17 කින් ඉහළ ඵලදායිතාවයක් දක්නට ලැබේ.

6.3 මානව සම්පත් සංවර්ධනය - (සියළුම දේශීය පුහුණු අවස්ථා)

අනු අංකය	පුහුණු වැඩසටහන	ඉලක්කගත කණ්ඩායම	පැවැත් වූ දිනය	දින / පැය ගණන	සහභාගිත්ව සංඛ්‍යාව	ප්‍රගතිය		
						ඇස්තමේන්තු ගත මුදල (රු)	සත්‍ය වියදම (රු)	සහභාගිත්ව ප්‍රතිශතය
1	කාර්යාල කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය නිලධාරීන්	2022.01.25	පැය 6	39	20,252.00	15,450.00	76%
2	ගිනි නිවීම පිළිබඳ පුහුණු වැඩසටහන	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය නිලධාරීන්	2022.03.09	පැය 3	49	9,286.00	9,186.00	99%
3	පිළිගැනීමේ නිලධාරීන් සඳහා වන පුහුණු වැඩසටහන	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යාල කාර්ය සහයක නිලධාරීන්	2022.03.10	පැය 3	20	6,356.00	2,100.00	33%
4	කාර්මික නිලධාරීන් හා තාක්ෂණ නිලධාරීන් සඳහා වන පුහුණු වැඩසටහන	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල කාර්මික නිලධාරීන් හි තාක්ෂණ සහයක නිලධාරීන්	2022.03.11	පැය 6	45	42,880.00	33,120.00	77%
5	කාර්යාල කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන (අදියර 2)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය නිලධාරීන්	2022.03.18	පැය 6	37	20,752.00	13,300.00	64%
6	රියදුරු මහතුන් සඳහා වන පුහුණු වැඩසටහන (වාහන නඩත්තුව හා ආචාර ධර්ම)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රියදුරු මහතුන්	2022.03.21	පැය 6	17	14,732.00	11,155.00	76%
7	ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ පුහුණු වැඩසටන	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල ගණකාධිකාරීවරුන් , ප්‍රසම්පාදන විෂය නිලධාරීන්	2022.03.24	පැය 6	48	39,840.00	34,270.00	86%
8	ධනාත්මක ආකල්ප පිළිබඳ පුහුණු වැඩසටහන	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය නිලධාරීන්	2022.03.28	පැය 3	28	11,216.00	8,510.00	76%
9	මූලික විමර්ශන කටයුතු පිළිබඳ පුහුණුව	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල පරිපාලන නිලධාරීන්, විෂය නිලධාරීන්	2022.03.29	පැය 6	43	36,936.00	34,710.00	94%
10	ආකල්ප සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසහන	දිස්ත්‍රික් ලේකම් කාරියාලයේ නිලධාරීන් , ප්‍රාදේශීය ලේකම්වරුන්, සහකාර ප්‍රාදේශිය ලේකම්වරුන්, ග්‍රා.නි	2022.03.30	පැය 3	118	40,375.00	40,375.00	100%
එකතුව					**444**	**242,625.00**	**202,176.00**	**83%**
1	නිවාඩු විෂය පිළිබඳ පුහුණුව	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය නිලධාරීන්	2022.06.15	දින 01	25	29,720.00	14,140.00	48%

2	ඉංග්‍රීසි ලිපි සකස් කිරීම පිළිබඳ පුහුණුව	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය නිලධාරීන්	2022.06.29	පැය 03	21	12,560.00	11,900.00	95%
එකතුව					**46**	**42,280.00**	**26,040.00**	62%
1	Payroll වැඩසටහන පිළිබඳ පුහුණු වැඩසටහන	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ගණකාධිකාරීවරුන් හා විෂය භාර නිලධාරීන්	2022.08.31-2022.09.02	18 (දින 03)	18	28,050.00	28,050.00	100%
එකතුව					**18**	**28050**	**28050**	100%
1	නීතිය හා සාමය පවත්වාගැනීම පිළිබඳ පුහුණු වැඩසටහන	ග්‍රාම නිලධාරීන්	2022.12.12	3	200	129,740.00	118,550.00	91%
2	ආයතන සංග්‍රහය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහන	සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන් හා පරිපාලන නිලධාරීන්	2022.12.14	6	31	34,740.00	32,542.00	94%
3	ආනති කළමනාකරණ පුහුණු වැඩසටහන	දිස්ත්‍රික් ලේකම් කාර්යාල නිලධාරීන්	2022.12.27	3	203	68,400.00	58,450.00	85%
එකතුව					**434**	**232,880.00**	**209,542.00**	**90%**
මුළු එකතුව					**942**	**545,835.00**	**465,808.00**	**85%**

07 - පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ අවශ්‍යතාව	අනුකූල වීමේ ප්‍රකාශය (අනුකූල වේ/ නොවේ)	අනුකූල නොවීම පිළිබඳ කෙටි කරුණු දැක්වීමක්	අනාගතයේදී කාර්ය ඉටු නොකිරීම වැලැක්වීමට යෝජනා කරන නිවැරදි කිරීමේ කටයුතු
1	**පහත මූල්‍ය ප්‍රකාශන/ ගිණුම් නියමිත දිනයේදි ඉදිරිපත් කර තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	වෙළඳ හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකිරම් ගිණුම්)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකිරම් ගිණුම්	අනුකූල වේ		
1.6	වෙනත්	අදාල නොවේ		
2	**පොත් සහ ලේඛන පවත්වාගෙන යාම**			
2.1	රා.ප.ව. 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කරමින් පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල වැටුප් ලේඛනය/පුද්ගල වැටුප් පත් යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලු මාසික ගිණුම් සාරාංශ (CIGAS) සකස් කර නියමිත දිනට භාණ්ඩාගාරයට යවා තිබේ	අනුකූල වේ		
2.6	චෙක්පත් සහ මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	බඩු ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	ඇප ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උපපත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යය අභිනියෝජනය (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුල අභිනියෝජනය කර ඇත.	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල අභිනියෝජනය ආයතනය තුල සන්නිවේදනය වී තිබේ.	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු අතරින් සිදු වන ආකාරයට බලතල අභිනියෝජනය කර ඇත.	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2014 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ වැටුප් මෘදුකාංගය භාවිත කිරීමේදී ගණකාධිකාරිවරුන් විසින් පාලනයන් අනුගමනය කර ඇත.	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත.	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඇත.	අනුකූල වේ		
4.3	වාරෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර ඇත	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තු සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට(NBD) යවා ඇත	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය කලට වේලාවට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට යවා ඇත	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	සියලුම විගණන විමසුම් සඳහා පිළිතුරු විගණකාධිපති විසින් නියම කර ඇති කාලය තුල යවා ඇත.	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2), DMA/1-2019 ප්‍රකාරව විගණකාධිපති විමසා වර්ෂය ආරම්භයේදීම අභ්‍යන්තර විගණන සැලැස්මක් සක්ස් කර ඇත.	අනුකූල වේ		
6.2	සියලු අභ්‍යන්තර විගණන වාර්තා සඳහා මසක් ඇතුලත පිළිතුරු සපයා තිබේ.	අනුකූල වේ		
6.3	සියලු අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත.	අනුකූල වේ		
6.4	මු.රෙ. 134 (3) අනුව සියලු අභන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර ඇත.	අනුකූල වේ		
7	**විගණන සහ කළමනාකරණ කමිටුව**			
7.1	කළමනාකරණ විගණන දෙපා. චක්‍රලේඛ 1-2019 ප්‍රකාර වර්ෂයක් තුල අවම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 4ක් පවත්වා ඇත.	අනුකූල වේ		

8	**වත්කම් කළමනාකරණය**			
8.1	වත්කම් මිලදී ගැනීම සහ විනාශ කිරීම පිළිබඳ තොරතුරු වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 ඡේද අංක 07 ප්‍රකාරව පාලක ජනරාල් නිලධාරියාට ඉදිරිපත් කර ඇත.	අනුකූල වේ		
8.2	චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීමට සම්බනධීකරණ නිලධාරියෙක් පත්කර, එම නිලධාරියාගේ විස්තර එම චක්‍රලේඛයේ 13 ඡේදයේ දැන්වෙන පරිදි පාලනාධිකාරී කාර්යාලයට යැවීම	අනුකූල වේ		
8.3	භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා අදාළ වාර්තා රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 ප්‍රකාරව නියමිත දිනට ඉදිරිපත් කරන ලදී.	අනුකූල වේ		
8.4	භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරනය වූ අතිරික්ත සහ හිඟය සහ ඒ හා සම්බන්ධ නිර්දේශ, ක්‍රියාමාර්ග චක්‍රලේඛයේ දැක්වෙන නියමිත කාලය තුල සිදු කරන ලදී.	අනුකූල වේ		
8.5	මු.රෙ. 772 ප්‍රකාරවනුසුදුසු භාණ්ඩවිනාශ කර ඇත	අනුකූල වේ		
9	**රථවාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහනවල දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ සකස් කර නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.	අනුකූල වේ		
9.2	භාවිතයට නුසුදුසු වාහන නුසුදුසුබවට තීරණය කර මාස 6කට නොඅඩු කාලයක් ඇතුලත විනාශ කර ඇත.	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් ඇත.	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 සහ 110 ප්‍රකාරව පියවර ගෙන ඇත.	අනුකූල වේ		
9.5	වාහනවල ඉන්ධන පරිභෝජනය 2016.12.29 දිනැති රා.ප.ව. 30/2016 3.1 ඡේදය අනුව නැවත පරීක්ෂණය කර ඇත.	අනුකූල වේ		
9.6	ලීසිං වාහනවල ලීසිං කාලය අවසන් වූ පසුව පරම අයිතියට වාහන ලොග් පොත මාරු කර ඇත	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	බැංකු සැසඳුම් ප්‍රකාශනය සකස් කර සහතික කරවාගෙන නියමිත දිනදී විගණනය සඳහා සූදානම් කර ඇත.	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂය තුල හෝ පෙර වර්ෂයේ සිට පැවත ආ අක්‍රිය ගිණුම් නිරවුල් කර ඇත.	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශනයෙන් අනාවරණය වූ ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ඇති අතර ඒවාට ගැලපීම් කර මාසයක් ඇතුලත් එම ශේෂ නිරවුල් කර ඇත.	අනුකූල වේ		
11	**ප්‍රතිපාදනඋපයෝගී කර ගැනීම**			
11.1	සීමා නොඉක්මවමින් වෙන් කර දුන් ප්‍රතිපාදන වැය කර ඇත	අනුකූල වේ		
11.2	බැරකම් මු.රෙ. 94(1) අනුව වර්ෂය අවසානයේ ඉතිරි ප්‍රතිපාදන ඉක්මවා නැත	අනුකූල වේ		
12	**රාජ්‍ය නිලධාරීන්සඳහා අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවලට අනුකූල වේ	අනුකූල වේ		
12.2	අය වීමට ඇති ණය පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර ඇත.	අනුකූල වේ		
12.3	වර්ෂයකට වඩා වැඩි කාලයක් තුල අය විය යුතු ණය ශේෂ නිරවුල් කර ඇත.	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	ඉකුත් තැන්පත් ඉවත් කිරීම සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාර කටයුතු කර ඇත.	අනුකූල වේ		
13.2	පොදු තැන්පත් පාලන ගිණුම යාවත්කාලීනව පවත්වාගෙන ගොස් තිබේ.	අනුකූල වේ		
14	**අක්මුදල් ගිණුම**			
14.1	මුදල් පොතේ සමාලෝචිත වර්ෂාවසාන ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර ඇත	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය උප අක්මුදල් කාර්යය සම්පූර්ණ කර මාසයක් ඇතුලත නිරවුල් කර ඇත	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවමින් තත්කාර්ය උප අක්මුදල් නිකුත් කර ඇත.	අනුකූල වේ		
14.4	අක්මුදල් ගිණුමේ ශේෂය මාසිකව භාණ්ඩාගාර පොත් සමග සසඳා ඇත	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	ආදායමින් මුදල් ආපසු ගැනීම රෙගුලාසි ප්‍රකාරව සිදු කර තිබේ.	අනුකූල වේ		

15.2	රැස් කළ ආදායම් තැන්පත් ගිණුමට බැර නොකර ඍජුවම ආදායම් ගිණුමට බැර කර ඇත.	අනුකූල වේ		
15.3	හිඟ ආදායම් ලැබීම් මු.රෙ. 176 ප්‍රකාරව විගණකාධිපතිට යොමු කර ඇත.	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	කාර්ය මන්ඩලයට ගෙවීම් අනුමත කාර්ය මණ්ඩලය තුල සිදු කර ඇත.	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන්ට ලිඛිත රාජකාරි ලැයිස්තු ලබා දී ඇත.	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති අංක 04/2017 දරන චක්‍රලේඛය ප්‍රකාරව සියලුම වාර්තා MSD වෙත ඉදිරිපත් කර ඇත.	අනුකූල වේ		
17	**මහජනයාට තොරතුරු ලබා දීම සම්බන්ධ ප්‍රතිපාදන**			
17.1	තොරතුරු ලබාගැනීමේ අයිතිවාසිකම් පනත සහ නියෝගවලට අනුව තොරතුරු නිලධාරියෙක් පත් කර විධිමත් තොරතුරු ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ඇත.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු වෙබ් අඩවිය හෝ විකල්ප වැඩ ක්‍රියාමාර්ග හරහා මහජනතාවට ලබා දී ඇති අතර මෙම වෙබ් අඩවිය හෝ විකල්ප ක්‍රියාමාර්ග මගින් මහජන අධිකාරියට එරෙහිව මහජනතාවට චෝදනා කිරීමට / චෝදනා කිරීමට පහසුකම් සලසා තිබේද යන්න.	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 8 සහ 10 වගන්ති ප්‍රකාරව අර්ධ වාර්ෂික සහ වාර්ෂික වාර්තා ඉදිරිපත් කර ඇත.	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මත කිරීම**			
18.1	රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ අංක 05/2008 සහ 05/2008(1) දරන චක්‍රලේඛ ප්‍රකාරව පුරවැසි ප්‍රඥප්තියක්/පුරවැසි සේවාදායක ප්‍රඥප්තියක් සකස් කර ආයතනය විසින් ක්‍රියාත්මක කර ඇත	අනුකූල වේ		
18.2	චක්‍රලේඛයේ 2.3 ඡේදයට අනුව පුරවැසි ප්‍රඥප්තිය / පුරවැසි සේවාදායකයාගේ ප්‍රඥප්තිය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය හා තක්සේරු කිරීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර ඇත.	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්මක් සකස් කිරීම**	අනුකූල වේ		
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 හි ඇමුණුම් 02හි ආකෘතියෙන් මානව සම්පත් සැලැස්මක් සකස් කර ඇත.	අනුකූල වේ		
19.2	එකී මානව සම්පත් සැලැස්ම තුල කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුටම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු අවම පුහුණු අවස්ථා ලබා දී ඇත.	අනුකූල වේ		
19.3	ඉහත කී චක්‍රලේඛයේ ඇමුණුම 01 ආකෘතිය මත පදනම්ව සමස්ථ කාර්ය මණ්ඩලයම සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර ඇත.	අනුකූල වේ		
19.4	ඉහත කී චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම,ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම සහ කුසලතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කර වගකීම පවරා ඇත.	අනුකූල වේ		
20	**විගණන ඡේද සඳහා පිළිතුරු**			
20.1	පෙර වර්ෂ සඳහා වගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේදවල දැක්වූ අඩුපාඩු නිවැරදි කර ඇත.	අනුකූල වේ		

ඡ. ඡායාරූප එකතුව - විවිධ



































ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. SGCG/RT/A/DSR-FA/SUM/02/2022/44 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2023 මැයි 09 දින.

රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
09 MAY 2023
ගිණුම් අංශය

දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
රත්නපුර.

ශීර්ෂය 278 - රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව සම්පිණ්ඩන විගණන වාර්තාව

2022 වර්ෂය සඳහා සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ඊට අදාළ නිරීක්ෂණ ඇතුළත් සම්පිණ්ඩන විගණන වාර්තාව මේ සමග එවා ඇත.

ඩී.පී.එම්.කුමාරනායක
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

පිටපත : අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ශීර්ෂය 278 - රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 278 - රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 08 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි .

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 පුනරාවර්තන වියදම්

භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව වැය විෂයයන්ගේ ප්‍රතිපාදන ඉතිරිය, දෙපාර්තමේන්තු වැය ලෙජරය සමඟ සැසඳීමේදී වැය විෂයයන් 11කට අදාළව රු. 2,172,149ක වෙනසක් පැවැතිණි.

1.6.2 අග්‍රිම සැසඳුම් ප්‍රකාශනය

(අ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ අග්‍රිම සැසඳුම් ප්‍රකාශනයේ වෙනත් ආයතන වෙනුවෙන් එකතු කළ ආදායම් ලෙස රු. 40,295ක් දක්වා තිබුණි. එහෙත්, එම ලැබීම් හිමි ආයතනයේ ආදායම් ශීර්ෂය පැහැදිලි කර දීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත් වී තිබුණි.

(ආ) දෙපාර්තමේන්තු පොත් අනුව, 2022 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පතු ගිණුමේ හර හා බැර ශේෂ, එදිනට භාණ්ඩාගාර මුද්‍රිත අනුව එම ශේෂ හා සැසඳීමේදී පිළිවෙලින් රු. 29,535ක හා රු. 10,760ක වෙනසකම් පැවැතිණි. මෙම වෙනස්කම් අග්‍රිම සැසඳුම් ප්‍රකාශනයේ ගැලපීමට පියවර ගෙන නොතිබුණි.

1.6.3 මූල්‍ය නොවන වත්කම්

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18ක සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඇතුළුව උප ආයතන 19ක මූල්‍ය ප්‍රකාශන අනුව මූල්‍ය නොවන වත්කම් ශේෂවල එකතුවට වඩා රු. 45,905,518ක් වැඩියෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය දක්වා තිබුණි.

1.6.4 දේපළ පිරියත හා උපකරණ සංචිතය

(අ) ගිණුම් සාරාංශයට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ඉවත් කිරීමේ ශේෂයට වඩා රු. 101,294ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන අනුව එදිනට එම ශේෂය දක්වා තිබුණි.

(ආ) ලේඛනාගාරයේ රාක්ක සකස් කිරීමට සමාලෝචිත වර්ෂය තුළ ගෙවූ රු. 1,566,312ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) ශේෂ පිරික්සුමට අනුව සමාලෝචිත වර්ෂය තුළ යන්ත්‍රෝපකරණ මිල දී ගැනීමට වැය කළ මුදලට වඩා රු. 410,433ක් අඩුවෙන් එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය අනුව දේපළ පිරියත හා උපකරණ සංචිතයේ ආරම්භක ශේෂයට වඩා රු.189,501ක් අඩුවෙන් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ එම ශේෂය දක්වා තිබුණි.

1.6.5 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව මූලධන වත්කම් අත්පත් කර ගැනීම්වලට වඩා රු.14,956,813ක් වැඩියෙන් එම වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ආ) මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම සහ කාර්යය මණ්ඩල පුහුණු සඳහා දරන ලද රු. 14,956,813ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූලධන වත්කම් අත්පත් කරගැනීම් යටතට ඇතුළත් කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමනාකරණය

(අ) නිසි පරිදි අග්‍රිම අවශ්‍යතා සැලසුම් නොකිරීම නිසා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය තුළ දී ලබා ගැනීමට සැලසුම් කළ අග්‍රිමයට වඩා රු. මිලියන 2303ක් වැඩියෙන් අග්‍රිම ඉල්ලුම් කර තිබුණි.

(ආ) ගම සමග පිළිසඳරක් වැඩසටහන යටතේ ව්‍යාපෘති 12ක වැඩ අවසන් වී තිබුණ ද, 2022 වර්ෂය තුළ අක් මුදල් නොමැති වීම නිසා රු. මිලියන 6.5ක් ගෙවීමට නොහැකි වී තිබුණි.

.22 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 (ii) පටහැනිව, වැය විෂයයන් 09ක ශුද්ධ ප්‍රතිපාදනයේ ඉතිරිවීම් සියයට 13ත් සියයට 90ත් අතර පරාසයක පැවැතිණි.

2.3 බලය නොලත් කාරක පාඩු

ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වාහනයකට අනතුරකින් සිදු වූ හානිය කපාහැරීමට ගෙන ඇති තීරණය සම්පූර්ණයෙන් වැරදි සහගත බව පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) විසින් දක්වා තිබුණද, රු. 292,897ක් වූ එම ශේෂය පොත්වලින් කපාහැර තිබුණු බවට මූල්‍ය ප්‍රකාශන අනුව තහවුරු විය.

2.4 බැරකම් හා බැදීම්වලට එළඹීම

මුදල් රෙගුලාසි 94 (i) අනුව සහ අංක 255/2017 හා 2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 (අ) ඡේදය අනුව, ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැඳීම් ඇතිකර නොගත යුතු වුවද, වැය විෂයයන් 07ක් වෙනුවෙන් රු. 6,546,034ක බැඳීම් සඳහා එළැඹ තිබුණි. එමෙන්ම, එම චක්‍රලේඛයට පටහැනිව, මෙම බැරකම් සිගාස් ගිණුම්කරණ පද්ධතියේ යාවත්කාලීන කර නොතිබුණි.

2.5 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11ක් වෙත වෙනත් අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු 27කින් අවශ්‍යතා 94ක් සඳහා ලබාදුන් රු. මිලියන 304ක ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂ අවසානයේ රු. මිලියන 115ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිවීම්, මුළු ප්‍රතිපාදනවලින් සියයට 10ත් සියයට 100ත් අතර පරාසයක් ගෙන තිබුණි.

2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක වර්ෂ 02 ඉක්ම වූ රු.54,398,346ක තැන්පතු 627 ක් මුදල් රෙගුලාසි 571 අනුව නිරවුල් කර නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය අනුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක වාහන 18 ක් වෙනුවෙන් 2022 වර්ෂය සඳහා ඉන්ධන පරීක්ෂාව සිදු කර නොතිබුණි.

2.7 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

ස්ථාන මාරු වී ගිය, විශ්‍රාම ගිය, සේවය හැර ගොස් වර්ෂ 02ක් ඉක්ම වූ, මිය ගොස් මාස 05 සිට මාස 28 ක් කල්ගත වී තිබුණු, වැඩ තහනම් කළ ද අවසාන වාරිකය අයකර මාස 06 සිට අවුරුදු 14 දක්වා කිසිදු වාරිකයක් අය නොකළ ආදී ලෙස නිලධාරීන් 18 දෙනෙකුගෙන් රු. 2,483,201 ක ණය ශේෂයක් අයවිය යුතුව පැවැතිණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක සමාලෝචිත වර්ෂය තුළ නිම කිරීමට අපේක්ෂා කළ ඇස්තමේන්තුගත පිරිවැය රු. 20,400,000ක් වූ ව්‍යාපෘති 29ක් නිම නොකර අත්හැර දමා තිබුණි.

3.1.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

(අ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 16ක 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ විකල්ප ඉඩම් ලබා දීමට හඳුනාගත් පවුල් සංඛ්‍යාව 2434 ක් වුවද, ඉන් පවුල් 791කට 2022 දෙසැම්බර් 31 දින දක්වාම ඉඩම් ලැබී නොතිබුණි.

(ආ) රත්නපුර දිස්ත්‍රික්කය තුළ 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ ගංවතුර හා නායයෑම් නිසා හානියට පත් නිවාස වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 වන විට ගෙවිය යුතු මුදල රු. 464,881,102 ක් විය. 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ගෙවිය යුතු රු. 312,437,884ක ශේෂයක් ද මෙම හිඟතිටි ශේෂය තුළ පැවැති අතර වන්දි ගෙවීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම මෙම ප්‍රමාදයට හේතු වී තිබුණි.

3.1.3 ප්‍රමාණවත් පරිදි ඉටු නොකළ ව්‍යාපෘති

(අ) කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වූ අධිකාරිය වැව ඉස්මත්ත සහ ව ගස්කොළන් වැඩුණු ප්‍රදේශයක් වුවද, විකල්ප අවශ්‍යතා හඳුනා නොගෙන රු. 18,300ක් වැයකර තවත් වන පැළ රෝපණය කර තිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, එම නිල නිවස හා පුහුණු ඒකකයේ පවිත්‍රතා කටයුතු වෙනුවෙන් වාර්ෂිකව රු. 8,086,740ක් ගෙවා තිබුණි. එහෙත්, ගිවිසුම් කොන්දේසි පරිදි ගෙවීම් කිරීමට පෙර පවිත්‍රතා කටයුතුවල ගුණාත්මකභාවය පිළිබඳ අධීක්ෂණ නිලධාරියෙකුගෙන් වාර්තා ලබා ගෙන නොතිබුණි. එමෙන්ම, පුහුණු ඒකකය අවට භූමිය වල් බිහි වී නඩත්තුවක් රහිතව පැවැතුණි.

(ඇ) "සෞභාග්‍යයේ විශේෂ නිවාස වැඩසටහන" යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් මඟින් 2021 හා 2022 වර්ෂවල දී ප්‍රතිලාභීන් 63 දෙනෙකු වෙත රු. 28,925,000ක් නිවාස ආධාර ලෙස ලබා දී තිබුණි. ඒ වෙනුවෙන් සවිස්තරාත්මක ලිපිගොනුවක් පවත්වා නොතිබුණු අතර, ප්‍රතිලාභී ඉල්ලීම් ලිපි නොතිබූ අවස්ථා ද නිරීක්ෂණය විය. එමෙන්ම, හිමිකම නිරවුල් වී නොතිබුණු ඉඩම් 24ක් වෙනුවෙන් ද ණය නිකුත් කර තිබුණි. ඒ හැර පවුලේ අවම සාමාජික සංඛ්‍යාව 04 දෙනෙකු වීම, වැන්දඹු හෝ ආබාධිත අය සිටින පවුල්වලට ප්‍රමුඛතාව ලබා දීම, කාර්මික නිලධාරී නිර්දේශ මත හැර අවසාන වාරිකය නිදහස් නොකිරීම වැනි ණය ලබා දීමේ කොන්දේසිවලට පටහැනිව ණය නිකුත් කර තිබුණි. ඉහත කරුණු මත, ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ විනිවිදභාවයක් නොතිබීම නිසා සුදුසු ප්‍රතිලාභීන් වෙත ණය නිකුත් කළේද යන්න අවිනිශ්චිත විය.

(ඈ) කුරුවිට, කොස්ගොඩ මලං ඇලේ ඉවුරු නිසි පරිදි සකස් කර නොතිබීමත්, ඇල කැපීමෙන් එය වෙල්යායට වඩා පහත් වීමත් නිසා කුඹුරු යායට ජලය පහසුවෙන් ලබා ගත නොහැකි වීමෙන් ඒ වෙනුවෙන් වැයකළ රු. 970,874කින් ප්‍රමාණවත් ප්‍රගතියක් ලැබී නොතිබුණි.

(ඉ) කුරුවිට, පැරඩයිස් වැවේ සිට මහදෙනිය වෙල්යාය දක්වා ජලය ගෙන යන ඇල දෙපස ඉදිකළ කොන්ක්‍රීට් බැම්ම නිසි පරිදි ඉදි නොකිරීමත් කුඹුරුවලට වඩා ගැඹුරට ඇල කැපීමත් නිසා කුඹුරුවලට ජලය පහසුවෙන් ලබාගත නොහැකි වීමෙන් ඒ වෙනුවෙන් වැයකළ රු. 970,874කින් ප්‍රමාණවත් ප්‍රගතියක් ලැබී නොතිබුණි.

3.1.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

සමාලෝචිත වර්ෂය තුල රු. මිලියන 2664 ක ව්‍යාපෘති 7470 ක් අනුමත කර තිබුණ ද, රු.මිලියන 151 ක් වැය කර ව්‍යාපෘති 334 ක් පමණක් වර්ෂය අවසානය වන විට ඉටුකර තිබුණි.ඒ අනුව, මූලධන ව්‍යාපෘතිවල භෞතික කාර්යසාධනය සියයට 4 ක් වැනි අඩු ප්‍රතිශතයක් ගෙන තිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

(අ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10ක වූ රජයේ ගොඩනැගිලි 79 ක් අභාවිතව පැවතුණි.

(ආ) ජීප් රථයක් හා බවුසර් රථයක් වසරකට වැඩි කාලයක සිටත් සහ ලොරියක් දීර්ඝ කාලයක සිටත් අවශ්‍ය අලුත්වැඩියා සිදු නොකිරීම නිසා දිරාපත් වෙමින් පවතී. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට රථ ගාලක් නොමැති වීම වාහනවල මතුපිට ආරක්ෂාවට බලපෑමක් ඇති කර තිබුණි.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 කට අදාළව වාහන 03ක්, වතුර මෝටර් ඇතුළු විවිධ යන්ත්‍ර උපකරණ 47 ක්, විවිධ පොත් 79 ක් හා නිදන බෑග් 10 ක් වසර 05 ක පමණ කාලයක සිට අභාවිතව පවතී.

3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

මුදල් රෙගුලාසි 880 සහ අංක 07/2019 හා 2019 මාර්තු 23 දිනැති අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ වක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක ඇප තැබිය යුතු නිලධාරීන් 33 දෙනෙකුගෙන් ඇප මුදල් ලබා ගෙන නොතිබුණි.

3.4 පාඩු හා හානි

(අ) සංවෘත පරිපථ රූපවාහිනී කැමරා (CCTV Camera) 117ක් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2021 වර්ෂයේ දී ගෙවා තිබුණද, ඉන් 04ක් සපයා සවි නොකිරීම නිසා රු. 209,383ක් නොකළ වැඩ වෙනුවෙන් ගෙවා තිබුණි.

(ආ) එකඟ වූ පිරිවිතරවලට අනුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සවිකළ විදුලි සෝපානයේ අභ්‍යන්තර පළල 50 mm කින් අඩුවීම නිසා රු. 212,273ක් නොකළ වැඩ වෙනුවෙන් ගෙවා තිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2021 වර්ෂය තුළ අවස්ථා කිහිපයක දී පරිගණක මිළ දී ගැනීම් වෙනුවෙන් රු. 6,779,550ක් වැයකර තිබුණි. වර්ෂය තුළ වරින්වර මිළ දී ගැනීම වෙනුවට සමස්ත අවශ්‍යතාව පිළිබඳ සැලකිලිමත්ව නිසි සැලැසුමකට අනුව එක්වර මිළ දී ගත්තේ නම්, එක්වර වැඩි ඒකක ප්‍රමාණයක් මිල දී ගැනීමේ දී ඇතිවන මිලෙහි වාසිය ලබාගත හැකිව තිබුණි. එහෙත්, එලෙස කටයුතු නොකර වරින්වර පරිගණක 32ක් මිල දී ගැනීම නිසා රු. 1,475,600ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි. එමෙන්ම, 2021 දෙසැම්බර් මාසයේ රු. 163,000කට මිළ දී ගත් ඉන් එක් පරිගණකයක් 2022 සැප්තැම්බර් දක්වාම අභාවිතව ගබඩාවේ රඳවා තිබුණි.

(ඈ) කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මීගස්තැන්න නිවාස ව්‍යාපෘතියේ වූ මාර්ගවල පැති කාණු කොන්ක්‍රීට් කිරීමේ දී අදියර I යටතේ කම්බි වැර ගැන්නුම්, ඉවුරු කඩා හැලීම වැලැක්වීම සහ කාණු කැපීම සඳහා රු.119,906 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක් විසින් 2021 වර්ෂයේ නිමකළ කර්මාන්ත 05ක වැඩ විෂයයන් 07ක් සඳහා රු. 205,935ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඊ) කුරුවිට, පැරඩයිස් නව ජනපද සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ අලෙවි මධ්‍යස්ථානයේ වූ කඩකාමර කපරාරු කිරීමේ දී රු. 265,045ක් නොකළ වැඩ වෙනුවෙන් ගෙවා තිබුණි.

(උ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ බිම් මහලේ පිහිටි විදුලි පරිපථ පුවරුව ගිනි ගෙන විනාශ වීමෙන් රු. 4,143,204ක හානියක් සිදු වී තිබුණි. පොලිස් වාර්තාව හා මේ සම්බන්ධයෙන් පත්කළ පරීක්ෂණ මණ්ඩලයේ නිරීක්ෂණවලට අනුව, විදුලි පරිපථ පුවරුව නිසි ලෙස ආවරණය කර නොතිබීම මෙම හානියට හේතුව වී තිබුණි. අනතුර සිදු වී 2023 මාර්තු මාසයට මාස 14ක් ගත වී තිබුණද, මුදල් රෙගුලාසි 104 පරිදි වගකීම නිශ්චය කර හානිය ප්‍රතිපූරණය කර ගැනීමට ඇති හැකියාව සොයා බලා නොතිබුණි.

3.5 අනාර්ථික ගනුදෙනු

(අ) කිරිඇල්ල හොලිපිටිය පුරාණ ගල්ලෙන් විහාරස්ථානයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කොන්ක්‍රීට් කණු 12ක් යොදා ඉදිකිරීම් අතරමග අතහැර දැමීම නිසා ඒ වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවූ රු. 346,318ක් අනාර්ථික වියදමක් වී තිබුණි.

(ආ) රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2021 වර්ෂයේ දී කාබනික එනසාල් වගා කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. ඒ සඳහා රු. 1,891,548ක් වැයකර ඉදිකළ වියලන මධ්‍යස්ථානය අභාවිතව පැවැති අතර, රු. 400,000කට 2021 දෙසැම්බර් මාසයේ මිල දී ගත් වියලන යන්ත්‍රය එදින සිටම අක්‍රියව පවතී. මෙම ව්‍යාපෘතිය සඳහා සාධ්‍යතා අධ්‍යයන වාර්තාවක් සකස් කර නොතිබුණු අතර මේ දක්වාම ප්‍රගතිය පිළිබඳ පසුවිපරම් ද සිදුකර නොතිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ ප්‍රදේශයේ ගෙවතුවල පුද්ගලික පාරිභෝජනය සඳහා එනසාල් පැළ 02ක් හෝ 03ක් පමණක් වගාකර ගෙන සිටින පවුල් 20ක් පමණ සිටින බව භෞතික පරීක්ෂාවේ දී තහවුරු විය.

(ඇ) රත්නපුර, බටුගෙදර, හල්ගස්යායේ පුරන් වූ කුඹුරු අක්කර 20ක් අස්වැද්දීම අරමුණු කරගෙන රු. 1,164,000ක් වැයකර 2022 ජූනි මාසයේ දී එම වෙල්යායට ජලය සපයන වේල්ල ප්‍රතිසංස්කරණය කර තිබුණි. එහෙත්, 2022 සැප්තැම්බර් වන විටත් ගොවීන් දෙදෙනෙකු පමණක් අක්කර 1¼ක පමණ කැළයක් එළිපෙහෙලි කිරීම හැර වෙනත් ප්‍රගතියක් නොතිබීමෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

(ඈ) කුරුවිට, කාහේන්ගම පිහිටි සේවා පියස ගොඩනැගිල්ල විදුලිය හා ජලය නොමැතිකමින් වර්ෂයකට අධික කාලයක සිට අභාවිතව පැවැතීම නිසා ඒ වෙනුවෙන් වැය කළ රු. 1,165,048ක් අනාර්ථික ගනුදෙනුවක් වී තිබුණි

3.6 නිෂ්ඵල වියදම්

(අ) කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කිකිළි පැටව් 785ක් මිළ දී ගෙන වැඩසටහන් 02ක් යටතේ බෙදාහැර තිබුණි. ඉන් පැටව් 589 දෙනෙකු එනම්, සියයට 75කට වැඩි ප්‍රතිශතයක් රෝග වැළදීම වැනි හේතු මත බෙදා හැරීම් සිදුකළ මුල් කාලයේ දී ම මිය ගොස් තිබුණි. මේ නිසා එම පැටව් මිළ දී ගැනීමට වැය කළ රු.270,940ක් නිෂ්ඵල වියදමක් වී තිබුණි. එමෙන්ම, සාමාන්‍ය වශයෙන් කිකිළියන්ට කුකුළන්ගේ අනුපාතය 9:1 ක් වියයුතු වූවත්, එය 3:2ක් ලෙස අතාත්වික අගයක් ගෙන තිබුණි. පශු සම්පත් පිළිබඳ ප්‍රවීනතාවක් සහිත නිලධාරියෙකුගේ අධීක්ෂණයක් මෙම ව්‍යාපෘතිය ආරම්භයේ සිටම නොමැති වීම මීට හේතුව වී තිබුණි.

(ආ) කුරුවිට, කඳන්ගොඩ වාහන පිරිසිදු කරන ඇල අසල සිට වතුර පිල්ල දක්වා ඇල කපා දෙපස සකස් කර වර්ෂයක් ගත වීමට පෙර එවැනි කාර්යයක් ඉටු කළේ ද යන්න පවා දැකගත නොහැකි ලෙස දෙපස ඉවුරු කැඩී වල් බිහි වී පැවැතුණි. මේ නිසා ඒ වෙනුවෙන් දරන ලද රු. 1,892,459ක් නිෂ්ඵල වියදමක් වී තිබුණි.

3.7 විසඳා නොතිබුණු විගණන ඡේද

2015 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 3.12 (ඇ) (iv) ඡේදය යටතේ ඉදිරිපත් කළ නිරීක්ෂණ සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම විසඳා නොතිබුණි.

3.8 කළමනාකරණ දුර්වලතා

(අ) කිරිඇල්ල නව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා නිල නිවස ඉදිකිරීම සඳහා යෝජිත ඉඩම සියයට 45ක නායයෑමේ අවදානමක් පවතින බවට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් වාර්තාකර තිබුණ ද, එම ඉඩම පවරා ගැනීමේ කටයුතු තවදුරටත් ඉටුකරමින් පවතී.

(ආ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 02 ක වූ ක්‍රීඩා පිටි 03 ක් සංවර්ධනය කිරීමේ දී පස්, බොරලු හා පිඩලි ප්‍රවාහනයට හා බිම් සකස් කිරීමට පළාත් පාලන ආයතනවල යන්ත්‍රසූත්‍ර හා ශ්‍රම දායකත්වය ලබා ගත යුතු බවට ප්‍රතිපාදන ලබාදුන් අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික් ලේකම් වෙත උපදෙස් දී තිබුණි. එහෙත්, ඊට පටහැනිව එම කාර්යයන් රු. 2,293,895 ක් ගෙවා කොන්ත්‍රාත්කරුවන් මඟින් ඉටුකර ගෙන තිබුණි.

3.9 මෙහෙයුම් දුර්වලතා

(අ) 1989 මාර්තු 23 දිනැති අංක 18/89 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05ක මහජන ගැටලු වාර්තා වූ දිනය හා විසඳුම් ලබා දුන් දිනය ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඊට අනුබද්ධ ආයතන වෙත ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් වාර්ෂිකව රු.7,655,500 ක් ගෙවා තිබුණි. එහෙත්, ගිවිසුම් කොන්දේසි අනුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා කාන්තා නිලධාරිනියන් දෙදෙනෙකු යෙදවිය යුතු වුවද, එක් නිලධාරිනියක් පමණක් යොදවා තිබුණි. පුහුණු ඒකකයේ ආරක්ෂක නිලධාරියා දිවා රාත්‍රී අඛණ්ඩව රාජකාරියේ නියැළී තිබුණි. ආරක්ෂක නිලධාරීන් වෙනුවෙන් ලොග් සටහන් පවත්වා නොතිබුණු අතර, ඔවුන්ගේ රාජකාරී කටයුතු කිසිදු නිලධාරියෙකුගේ අධීක්ෂණයට යොමු වී නොතිබුණි. එමෙන්ම, ආරක්ෂක නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීමේ මුල් ලේඛන වෙනුවට, ඒවායේ ඡායා පිටපත් පාදක කර ගෙන මාසික ගෙවීම් සිදුකර තිබුණි.

(ඇ) බලංගොඩ, කුමාරගම, බෝමළුව අසල පැති බැම්මක් ඉදිකිරීමේ කර්මාන්තයේ ලොග් සටහන් පොත අනුව, ඉදිකිරීම් ආරම්භයේ සිට අවසානය දක්වාම කාර්මික නිලධාරියාගේ අධීක්ෂණයට ලක් වී නොතිබුණි. එහෙත්, එම ඉදි කිරීම් සතුටුදායක බවට ඔහු විසින් ලබා දුන් නිර්දේශය මත රු. 989,769ක් ගෙවා තිබුණි.

(ඈ) වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමේ වැඩසටහන මඟින් වාරික 12කින් ගෙවීමේ පදනම යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අදාළව ණය ලබාගත් ප්‍රතිලාභීන් 15 දෙනෙකුගෙන් හිඟහිටි රු. 132,100 ක ශේෂය වර්ෂ 02කට වඩා පැරණි විය.

(ඉ) ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 04ක් තුළ පැවැති සමෘද්ධි බැංකු 13 ක් මඟින් ලබා දී තිබුණු සමස්ත ණය වටිනාකමින් 2022 නොවැම්බර් 30 දිනට රු. 162,205,520 ක කල්පසු වූ ණය සහ රු. 45,244,077 ක බොල්ණය පැවතිය ද ඒවා අයකර ගැනීමට පැහැදිලි වැඩපිළිවෙලක් නොතිබුණි.

(ඊ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 06 ක් තුළ වූ ග්‍රාම නිළධාරී කාර්යාල 72 ක් පිහිටි රජයේ ඉඩම් 2022 නොවැම්බර් මාසය වනවිටත් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) ප්‍රජාපාදක සමිති හා කොන්ත්‍රාත්කරුවන් 798 දෙදෙනෙකුගෙන් ලබාගත් රැඳවුම් මුදල් රු. 38,614,607 ක දෝෂ සහිත වගකීම් කාලය ඉක්මවා ගියද, ඒවා නිදහස් නොකර 2020, 2021 සහ 2022 වර්ෂවල සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක රඳවාගෙන තිබුණි.

(ඌ) කාන්තාවන් දිරිමත් කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වක්‍රීය ණය වැඩසටහන යටතේ ලබාගත් ණය මුදල සමාන වාරික 10 කින් ගෙවා අවසන් කළ යුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක ණයලාභීන් 33 දෙනෙකු ලබාගත් රු. 470,000 ක ණය මුදලින් රු. 256,336 ක් නිහඬිවිව පැවැති අතර 2022 දෙසැම්බර් 31 දිනට ණය අයවීමේ ප්‍රමාදය මාස 12 ත් මාස 120 ත් අතර පරාසයක පැවතුණි.

(එ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 09ක් විසින් 2022 දෙසැම්බර් 15 දිනට විශ්‍රාම වැටුප් රු. 10,180,455ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ඒ) පලාවෙල - දිමියාව මාර්ගය හා මිල්ලකඩේ පන්සල පාර අලුත්වැඩියා කිරීමේ කර්මාන්ත 2019 වර්ෂයේදී නිමකර තිබුණි. එහෙත්, පසුව සිදුකළ ස්ථානීය පරීක්ෂාවක දී මෙම මාර්ගවල ඉරිතැලීම් හා පළුදුවීම් නිරීක්ෂණය වී තිබුණි. ඒ නිසා ඒවා නැවැත පිළිසකර කිරීමට රු. 919,499ක් රඳවාගෙන ඉනිරි රැඳවුම් මුදල් නිදහස් කර තිබුණි. එසේවුවත්, එම මුදල් අඩුකරගත් 2019 වර්ෂයේ සිට මේ දක්වා වර්ෂ 04ක් ගත වී තිබුණ ද, රඳවාගත් එම මුදල් වැයකර අවශ්‍ය පිළියම් සිදුකර නොතිබුණි.

(ඔ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2022 දෙසැම්බර් 31 දිනට රජයේ ඉඩම් සඳහා බලපත්‍ර හා දීමනාපත්‍ර නිකුත් කිරීමේ දී, කාර්යාල 02 ක ඉඩම් කව්චේරි නොපැවැත්වීමත්, කාර්යාල 06 ක පවත්වන ලද ඉඩම් කව්චේරි ගණන 04 සිට 06ක් තරම් අඩු පරාසයක් ගෙන තිබීමත්, කාර්යාල 02 ක් විසින් අනවසර ඉඩම්වලින් නියමානුකූල කිරීමට තිබූ ඉඩම් ප්‍රමාණය හඳුනා නොගැනීමත්, හේතුවෙන් රත්නපුර දිස්ත්‍රික්කය තුළ අනවසර ඉඩම් නියමානුකූල කිරීමේ ක්‍රියාවලිය මන්දගාමී ස්වරූපයක් ගෙන තිබුණි.

3.10 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

සේවක සුභසාධනයට අවශ්‍ය ප්‍රතිපාදන, ආයතන සංග්‍රහයේ XXII වැනි පරිච්ඡේදයේ 2 වැනි වගන්තිය පරිදි ආයතන අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙතින් ඉල්ලුම් කිරීම වෙනුවට, දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ගොඩනැගිල්ලක පවත්වා ගෙන යන ආපන ශාලාවෙන් හා සුභසාධන වෙළඳසැලෙන් 2013 වර්ෂයත් 2022 වර්ෂයත් අතර කාලය තුළ ලද ගොඩනැගිලි කුලී රු. 2,671,760ක් සුභ සාධන සංගමයක් වෙත ලබා දී තිබුණි. මෙම කුළී ගාස්තු රජයේ ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබුණු අතර රජයේ ගොඩනැගිල්ලකින් උපයන කුළී ආදායම් සුභ සාධක සංගමයකට ලබා දීමට පවතින නෛතික හැකියාව සනාථ කරගත නොහැකි විය. එමෙන්ම, කිසිදු ටෙන්ඩර් කැඳවීමකින් තොරව 2020 වර්ෂයේ සිට මේ දක්වාම එකම කොන්ත්‍රාත්කරු විසින් ආපනශාලාව පවත්වා ගෙන යන අතර, ඔහු විසින් 2022 හා 2023 වර්ෂ සඳහා රු. 60,533 ක ජල බිල්පත් ද, සුභසාධන වෙළඳසැලෙන් රු. 35,459ක විදුලි බිල්පත් ද පියවා නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

(අ) අතිරික්ත සේවකයන් 197 දෙනෙකුගේ සේවා අවශ්‍යතාව හඳුනාගෙන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට හෝ ඵලදායි ලෙස වෙනත් ආයතන වෙත අනුයුක්ත කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ආ) ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උප්පැන්න, විවාහ, හා මරණ රෙජිස්ට්‍රාර් ධූරයක් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් සම්මුඛ පරීක්ෂණ පවත්වා 2022 අප්‍රේල් මාසයේ දී පත්වීම් ලබා දී තිබුණි. එහෙත්, එම ධූරය

යටතේ හෝ එවැනි තනතුරක හෝ කටයුතු කිරීමේ පළපුරුද්ද, කථන හැකියාව හා පුද්ගල පෞරුෂත්වය වෙනුවෙන් ලකුණු ලබා දී තිබුණ ද, ඒ සඳහා නිර්නායක හඳුනාගෙන නොතිබුණි. එමෙන්ම, අධ්‍යාපන සුදුසුකම් හා අත් අකුරු වෙනුවෙන් ලබා දුන් ලකුණුවල නිවැරදිතාව සනාථ කරගත නොහැකි විය. ඉහත කරුණු අනුව, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සිය වගකීම් නිසි පරිදි ඉටුකර නොතිබීම නිසා එම තනතුර සඳහා කළ පත්වීම මතභේදාත්මක විය.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 02 ක ග්‍රාම නිලධාරී වසම් 80 කින් වසම් 41 ක් සඳහා පත්කළ ග්‍රාම නිලධාරීන්, එම වසම් තුළ සේවා කාලය වර්ෂ 02 ත් වර්ෂ 19 ත් අතර පරාසයක විය.

ස්තූතියි.